ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,091 - 2018 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016/(2018)

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 දෙසැම්බර් මස ආරම්භ කොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2018 වසරේ මැයි මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත් වීමට හැකිවන පරිදි කාල සටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශ.—I වැනි කාර්යක්ෂමතා කඩඉම පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් I වැනි කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේ ය.

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*මුළු ලකුණු*	*සමත් ලකුණු*
1. මූල්‍ය ක්‍රම	පැය 02	100	40
2. පරිපාලනය	පැය 02	100	40
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - 1	පැය 02	100	40
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - 2	පැය 03	100	40

05. *විභාගය සඳහා වන විෂය නිර්දේශය* :

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
1. මූල්‍ය ක්‍රම	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (X වැනි පරිච්ඡේදය හැර)
2. පරිපාලනය	(*අ*) කාර්යාල ක්‍රම, කාර්යාල කළමනාකරණය හා කාර්යාල සංවිධානය කිරීම පිළිබඳ දැනුම (*ආ*) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතින්හි I - XXII දක්වා වූ පරිච්ඡේද සහ ආයතන සංග්‍රහයේ VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII පරිච්ඡේද
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - 1	සත්ත්ව පනත, සත්ත්ව රෝග පනත හා ආනුෂාංගික රීති, දෙපාර්තමේන්තුවේ නියෝග හා පශු වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - 2	(*අ*) නිදර්ශක බෙදා හැරීම පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනා ගැනීම් පරීක්ෂණ, බෝවන රෝග හා ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව. (*ආ*) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝ කිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බිජෞෂධය මගින් පැටවුන් ලබා ගැනීම හා ඇති දැඩි කිරීම, සත්ත්ව පෝෂණය පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව, වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය. (*ඇ*) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන් කිරීම, බටර් ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය. (*ඈ*) ඝාතනාගාරවලදී සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම.

පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

''දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.''

06. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පේරාදෙණිය නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍රය, අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස ගෙන සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු වේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

09. විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2018 ඔක්තෝබර් මස 19 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. :

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13,
ගැටඹේ, පේරාදෙණිය.

11. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් මගින් නිල වෙබ් අඩවියෙන් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් අකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම්කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඉහත විස්තර ඇතුළත් ලිපියක්, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට එය දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීමද සුදුසු වේ. එහිදී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුව ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :

(*අ*) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

	රු. ශත
(*ආ*) ඉන්පසු එක් එක් වතාව සඳහා-	
සම්පූර්ණ විභාගය සඳහා	1200 0
එක් විෂයයකට	600 0

මෙම විභාගයට මීට පෙර ඉල්ලුම්කරන ලද හෝ දැනටමත් පෙනී සිට ඇති හෝ අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුය. තව එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ ඇත්නම් එහි දී සිංහල නිවේදනය බලාත්මක වේ.

වෛද්‍ය නිහාල් වෙදසිංහ,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2018 සැප්තැම්බර් මස 11 වැනි දින.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ඔක්තෝබර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ඔක්තෝබර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ආදර්ශ අයදුම්පත
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016/2018
FIRST EFFICIENCY BAR EXAMINATION FOR THE OFFICERS IN THE SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE– 2016/2018

(විභාගයේ නම ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරේ දැක්විය යුතු ය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : GUNAWARDHANA. H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) :
(ඉංග්‍රීසි කැපිටල් අකරෙන්) :———.

2.1 දුරකථන අංකය :

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතු ය.) :

විෂය අංකය	*විෂය*

06. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින් ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන් ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

07. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

08. පදවි නාමය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

දෙපාර්තමේන්තුවේ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

09. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත්කරන ලද දිනය :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු. :————.
ගෙවන ලද කාර්යාලය :————.

රිසිට්පත් අංකය :————.

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය :————.

(*ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතුය.)

09-802/1

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016/(2018)

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 දෙසැම්බර් මස ආරම්භ කොට ජේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2018 වසරේ මැයි මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත් වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශය.*—II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් II වැනි කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	*විෂය අංකය*	*කාලය*	*මුළු ලකුණු*	*සමත් ලකුණු*
1 කොටස	01	පැය 03	100	40
හෝ				
2 කොටස	02	පැය 03	100	40
සහ				
3 කොටස		3 කොටසින් පත්‍ර 2 කට පිළිතුරු සැපයිය යුතුවේ.		
1 පත්‍රය	03	පැය 03	100	40
2 පත්‍රය	04	පැය 03	100	40
3 පත්‍රය	05	පැය 03	100	40
4 පත්‍රය	06	පැය 03	100	40
5 පත්‍රය	07	පැය 03	100	40
6 පත්‍රය	08	පැය 03	100	40
7 පත්‍රය	09	පැය 03	100	40
8 පත්‍රය	10	පැය 03	100	40
9 පත්‍රය	11	පැය 03	100	40
10 පත්‍රය	12	පැය 03	100	40
11 පත්‍රය	13	පැය 03	100	40

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය අංකය*	*විෂය නිර්දේශය*
1 කොටස	01	විෂය නිර්දේශයේ 2:1, 2:2, 4:1, 4:2, 5:2, 5:8, 6:5, 7:2:1, 8:2, 8:2:2, 8:2:3, 8:3:1, 9:2, 9:4, 9:6, 9:7 කොටස්
2 කොටස	02	විෂය නිර්දේශයේ 1:1:1:, 1:1:4, 1:2:1, 3:2, 3:1:1, 3:1:2, 3:2:1, 10:1:1, 10:1:2, 10:1:3, 10:1:4, 10:1:6, 10:2:1, 10:2:8 හා 10:4:1 කොටස්

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය අංකය*	*විෂය නිර්දේශය*
3 කොටස		
1 පත්‍රය	03	ව්‍යාධි විද්‍යාව
2 පත්‍රය	04	පශු සම්පත් ආර්ථික විද්‍යාව
3 පත්‍රය	05	පශු මහජන සෞඛ්‍ය
4 පත්‍රය	06	කෘෂි ව්‍යාප්තිය
5 පත්‍රය	07	ජාන විද්‍යාව හා අභිජනනය
6 පත්‍රය	08	සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය
7 පත්‍රය	09	සත්ත්ව නිවාස හා කළමනාකරණය
8 පත්‍රය	10	සත්ත්ව පෝෂණය
9 පත්‍රය	11	තෘණ හා ගෝචර තෘණ
10 පත්‍රය	12	ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව
11 පත්‍රය	13	ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය

සටහන.—II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස් 01 හෝ කොටස් 02 යන ප්‍රශ්නපත්‍ර දෙකින් එකකට හා කොටස් 03හි සඳහන් ප්‍රශ්නපත්‍ර 11 න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි. සාමාර්ථය සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු ය.

පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

''දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍යය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍යය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.''

06. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් ජේරාදෙණිය නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස ගෙන සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු වේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2018 ඔක්තෝබර් මස 19 වැනි දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. :

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13,
ගැටඹේ, ජේරාදෙණිය.

11. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් මගින් හා නිලවෙබ් අඩවියෙන් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුනු අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර ඇතුළත් ලිපියක්, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට එය දැන්වීමේ, සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසීම සුදුසුය. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපෑල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ පමණකි. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :—

(*අ*) ප්‍රථම වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

	රු. ශත
(*ආ*) ඉන්පසු එක් එක් වතාව සඳහා-	
සම්පූර්ණ විභාගය සඳහා	1,200 0
එක් විෂයයකට	600 0

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි හෝ මීට පෙර ඉල්ලුම්කරන ලද හෝ අපේක්ෂකයින් ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපෑල්/උප තැපෑල් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතු ය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පළවන නිවේදනයන් හි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

වෛද්‍ය නිහාල් වෙදසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2018 සැප්තැම්බර් මස 11 වැනි දින,
තැ. පෙ. 13,
ගැටඹේ, ජේරාදෙණිය.

ආදර්ශ අයදුම්පත

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016/(2018)

SECOND EFFICIENCY BAR EXAMINATION FOR THE OFFICERS IN THE SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE– 2016/(2018)

(විභාගයේ නම ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරේ දැක්විය යුතු ය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) : ————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

2.1 දුරකථන අංකය :

03. ස්ත්‍රී/පුරුෂභාවය :

ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතු ය.) :

විෂය අංකය	විෂය

06. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන් ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

07. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

08. පදවි නාමය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

දෙපාර්තමේන්තුවේ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

09. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත්කරන ලද දිනය :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

ගෙවන ලද විභාග ගාස්තුව : රු. :————.
ගෙවන ලද කාර්යාලය :————.
රිසිට්පත් අංකය :————.

ලදුපත ඇලවීම සඳහා
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න)

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය :————.

(*ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතු ය.)

09-802/2

I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත සංඥා සීනු සහ සංඥා එළි දුම්රිය ගේට්ටු ආරක්ෂක පද්ධති 200ක් සැපයීම, ස්ථාපනය, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කොට පෙන්වීම සහ නඩත්තුව

ප්‍රසම්පාදන අංකය: SRS/F.7595

ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර II, 7 වන මහලේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත සංඥා සීනු සහ සංඥා එළි දුම්රිය ගේට්ටු ආරක්ෂක පද්ධති 200ක් සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්, ඇටෝර්නි බලයක් මගින් බලය පවරන ලද බලයලත් නියෝජිතයෙකු මගින් ලංසු ඉදිරිපත් කළ හැකිය.

2. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

3. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් සතියේ දිනවල පෙ.ව. 9.00ට සහ ප.ව. 3.00 අතර පහත සඳහන් ලිපිනය වෙතින් වැඩි දුර තොරතුරු ලබාගැනීමට සහ එම ලිපිනයේ එම වේලාව තුළ දී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ, ශ්‍රී ලංකාව
දුරකථන අංකය: 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් අංකය: 94(11) 2432044
ඊමේල්: srs.slr@gmail.com
වෙබ් අඩවිය: www.railway.gov.lk

4. සුදුසුකම් අවශ්‍යතාවන්ට මෙයද ඇතුළත් වේ.

(අ) ලංසු ලිපිලේඛන සමග නිකුත් කරනු ලබන පිරිවිතරයන්ට අනුකූල වන පරිදි මෙම කොන්ත්‍රාත්තුව යටතේ භාණ්ඩ සැපයිය යුතුය.

(ආ) සැපයීමට අපේක්ෂා කරන එක් එක් අයිතමයේ සැලසුම් නිර්මාණ සහ නිෂ්පාදනය සඳහා වන ISO-9001: 2008 තත්ත්ව සහතිකයේ පිටපත් ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

5. (අ) යම් ලංසුකරුවකු වෙනුවෙන් යම් පුද්ගලයෙකු ඒජන්ත හෝ උප ඒජන්ත, නියෝජිතයෙකු හෝ නම් කළ අයෙකු ලෙස කටයුතු කරන්නේ නම් ඔහු, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතින් ඉල්ලා ඇති පරිදි ශ්‍රී ලංකාවේ පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ලංසු ඉදිරිපත් කිරීමට පෙර ලියාපදිංචි විය යුතුය. එම ලියාපදංචි සහතිකයේ මුල් පිටපත ලංසු සමග ඉදිරිපත් කළ යුතුය. එලෙස ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කිරීමට අපොහොසත් ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් පරිදි ලංසු ඉදිරිපත් කළ වහාම සහ ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට පෙර ලංසුකරුවන් තමන්ව ලියාපදිංචි කළ යුතුය. අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් ප්‍රකාරව ලියාපදිංචි සහතිකය ඉදිරිපත් නොකරන ඕනෑම එවැනි ලංසුකරුවෙකුට ප්‍රසම්පාදන ප්‍රදානය නොකෙරේ.

6. ආපසු ගෙවනු නොලබන රු.100,000/- ක හෝ ඕනෑම පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් එයට සමාන මුදලක් ප්‍රසම්පාදන ගාස්තුව ලෙස ගෙවීමෙන් අනතුරුව 2018.10.30 වෙනි දින ප.ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය හෝ විදේශ ශ්‍රී ලංකා දූත කාර්යාල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

7. ලංසු, 2018.10.31 වෙනි දින ප.ව. 2.00ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාර දිය යුතුය.

සභාපති,
ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව,
ලේකම් බාරේ,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය,
7 වන මහල, සෙත්සිරිපාය අදියර II
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු 2018.10.31 වෙනි දින ප.ව. 2.00ට ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, සෙත්සිරිපාය, අදියර II ,7 වන මහලේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේදී ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ විවෘත කරනු ලැබේ.

සභාපති,
ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද
ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,

යොමු අංකය: SRS/F-7595

09- 781

ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීමයි

Motive Power Sub Department වෙත Re-Railing උපකරණ සහ උපාංග සැලසුම් නිර්මාණය, නිෂ්පාදනය, සැපයීම සහ ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය: SRS/F.7570

ශ්‍රී ලංකාව, බත්තමුල්ල, සෙත්සිරිපාය අදියර 02, 7 වන මහලේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ Motive Power Sub Department වෙත Re-Railing උපකරණ සහ උපාංග සැලසුම් නිර්මාණය, නිෂ්පාදනය, සැපයීම සහ ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා ලෝක ව්‍යාප්ත පිළිගත් නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. විදේශීය ලංසුකරුවන් ශ්‍රී ලංකාවේ කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලයක් මගින් බලය පවරන ලද දේශීය නියෝජිතයකු මගින් තමන්ගේ ලංසු ඉදිරිපත් කළ හැකිය.

02. ලංසුකරුවන් විසින් ශ්‍රී ලංකා රුපියල් විසිපන් දහසක (රු. 25,000/-) ප්‍රසම්පාදන ගාස්තුවක් 2018.09.11 වෙනි දින සිට 2018.10.25 වෙනි දින දක්වා කාලය තුළ ගෙවීමෙන් 2018.09.11 වෙනි දින සිට 2018.10.25 වෙනි දින දක්වා රාජකාරි දිනයන්හි 9.00 පැය සහ 15.00 පැය (ශ්‍රී ලංකා වේලාවෙන්) අතර ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් ලංසු ලිපි ලේඛන සමග ලබා ගත හැකි ආකෘතිපත්වල ලංසු ඉදිරිපත් කළ යුතුය. විදේශීය ලංසුකරුවන් ශ්‍රී ලංකා රුපියල් විසිපන්දහසට (රු. 25,000/-) සමාන මුදලක් පරිවර්තනය කළ හැකි විදේශීය මුදල් වර්ගයකින් අදාළ රටවල්වල ශ්‍රී ලංකා දූත කාර්යාල වෙත ගෙවා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි වෙත ඉහත සඳහන් කාල සීමාව තුළදී ලංසු ලිපිලේඛන සහ ආකෘතිපත් එවන මෙන් ඉල්ලා සිටිය හැක. ප්‍රසම්පාදන ගාස්තුව වන ශ්‍රී ලංකා රුපියල් විසිපන්දහස (රු.25,000/) (හෝ එයට සමාන වටිනාකමින් යුත් පරිවර්තනය කළ හැකි විදේශීය මුදල් වර්ගය) වන ලංසු ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලංසු ලිපි ලේඛනයේ ආදර්ශ ආකෘතියක් ලංසුකරුගේ රටේ ඇති ශ්‍රී ලංකා දූත කාර්යාලයේ බලා ගත හැක.

03. ලංසු භාරගැනීම 2018.10.26 වෙනි දින 14.00 පැයේදී (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ. මුද්‍රා තබන ලද ලංසු, ලංසු භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හැකිය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
7 වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඉහත 03 වන ඡේදය යටතේ ලබා දී ඇති ලිපිනයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී හෝ අදාළ රටවල්වල ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

06. වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අය හා සම්බන්ධ වන්න.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
7 වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94(11) 2436818 හෝ 94(11) 2438078
ෆැක්ස්: 94(11) 2432044
ඊමේල්: srs.slr@gmail.com
වෙබ් අඩවිය: www.railway.gov.lk
යොමු අංකය: SRS/F. 7570

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
7 වන මහල,
සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

09- 782

බඩු බාහිරාදිය විකිණීම්

මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජ සන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2018.10.02 වැනි දින පෙ.ව. 10.00ට බලපිටිය අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනණු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේදී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේම ප.ව.4.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

සම්පත් එන්. ගමගේ,
මහෙස්ත්‍රාත්,
බලපිටිය.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව

අනු. අංකය	නඩු අංකය	වර්ගය
01.	58065	අංක SPJW 3706 ලොරි රථය
02.	34853	අංක SPWB 9596 යතුරු පැදිය
03.	අංක රහිත	අංකය හා වර්ගය නොමැති යතුරු පැදි 01
04.	අංක රහිත	දිරාපත් Mate යතුරු පැදි 01
05.	අංක රහිත	දිරාපත් අත් ට්‍රැක්ටරයක කොටසක්
06.	අංක රහිත	යතුරු පැදි කොටස් ප්‍රමාණය (සුන්බුන්)
07.	අංක රහිත	යකඩ ලිප් 01
08.	අංක රහිත	යකඩ ලිප් 01
09.	අංක රහිත	යකඩ ලිප් 01
10.	අංක රහිත	වතුර මෝටර්01
11.	අංක රහිත	වතුර මෝටර් 01
12.	අංක රහිත	වතුර මෝටර් 01
13.	අංක රහිත	වතුර මොටර් 01
14.	අංක රහිත	ජනෙල් ග්‍රිල් 05
15.	අංක රහිත	පරිගණක කැබලි ප්‍රමාණයක්
16.	අංක රහිත	සුදු පාට වතුර ටැංකි 01
17.	අංක රහිත	කුඩා කැසට් යන්ත්‍ර 01
18.	අංක රහිත	කුඩ කැසට් යන්ත්‍ර 01
19.	අංක රහිත	කුඩා කැසට් යන්ත්‍ර 01
20.	අංක රහිත	ඇම්ප් 02
21.	11502	යකඩ ලිප් 01
22.	11502	ගෑස් සිලින්ඩර් 01
23.	11502	ගෑස් සිලින්ටර් 01
24.	11502	ගෑස් සිලින්ඩර් 01
25.	11502	කෝප්ප කට්ටල 01
26.	11502	වඩු උපකරණය
27.	11502	හිරමන 03
28.	11502	වතුර මෝටරයක බටයක්
29.	11502	කම්පෙෂර් එකක කොටසක්
30.	11502	යකඩ ඝණ්ඩාරයක කොටසක්
31.	11502	රතුපාට ජලයේ ගිල්වන වතුර මෝටරයක්
32.	11502	යකඩ ප්‍රමාණයක්
33.	11502	යකඩ ලිප් රදවනයක්
34.	11502	සවල් 01
35.	11502	සවල් 01
36.	11502	සවල් 01
37.	11502	සවල් 01
38.	11502	අලවංගු 01
39.	අංක රහිත	අලවංගු 01
40.	අංක රහිත	වතුර මෝටර් 01
41.	අංක රහිත	ඇළුමිනියම් කල 01
42.	අංක රහිත	පෝසිලේන් ෆිල්ටර් 01
43.	අංක රහිත	පෝසිලේන් ෆිල්ටර් 01
44.	අංක රහිත	ටී. වී. 01
45.	අංක රහිත	ඇම්ප් 01
46.	අංක රහිත	ඇම්ප් 01
47.	අංක රහිත	ඇම්ප් 01
48.	අංක රහිත	බෆල් 02
49.	අංක රහිත	සයිඩ් කණ්ණාඩි ප්‍රමාණයක්
50.	අංක රහිත	හෙල්මට් 04
51.	අංක රහිත	යකඩ ඉනි 01
52.	අංක රහිත	3/4 බට 10
53.	අංක රහිත	මාළු දැලක්
54.	අංක රහිත	යකඩ නවන උපකරණ 01
55.	අංක රහිත	රේඩියෝ 01
56.	අංක රහිත	බෝට්ටුවක අතංගුවක්
57.	286	ඔරු 01
58.	අංක රහිත	සේරු 04
59.	අංක රහිත	නැංගුරම් 01
60.	අංක රහිත	යකඩ මෝටරයක කොටසක්
61.	අංක රහිත	චිමිනි ලාම්පු කොටස්
62.	අංක රහිත	වාහන බැටරි 03
63.	අංක රහිත	මුල්ලු 01
64.	අංක රහිත	මුල්ලු 01
65.	අංක රහිත	මුල්ලු 01
66.	අංක රහිත	අත් මුල්ලු 01
67.	අංක රහිත	ෆෑන් මෝටර් 01
68.	අංක රහිත	යකඩ කුඩ ප්‍රමාණයක්
69.	අංක රහිත	සවල් 01
70.	අංක රහිත	සවල් 01
71.	අංක රහිත	සවල් 01
72.	අංක රහිත	සවල් 01
73.	අංක රහිත	සවල් 01
74.	අංක රහිත	උදලු 01
75.	අංක රහිත	උදලු 01
76.	අංක රහිත	පැදුරු ප්‍රමාණයක්
77.	21867	පිකස් 01
78.	අංක රහිත	පොරෝ 01
79.	අංක රහිත	බියර් කේස් ප්‍රමාණයක්
80.	අංක රහිත	යකඩ කපන කතුරු 01
81.	අංක රහිත	ප්ලේයර් 01
82.	අංක රහිත	වයරින් වයර් රෝල් 01
83.	**කාර්යාල උපකරණ**	
1.	වානේ අල්මාරි 03	
2.	වානේ අල්මාරි (විදුරු දොර සහිත) 02	
3.	හීටර් 01	
4.	පරිගණක මොනිටර් (HP)01	
5.	පුටු ඇඳි සහිත (කැඩී ගිය) 02	
6.	සිවිලින්පංකා 01	
7.	බිත්ති පංකා 01	
8.	පාදස්තල විදුලිපංකා 01	
9.	පරිගණක පුටු 01	

09-708

ළමා මහෙස්ත්‍රාත් අධිකරණය - බත්තරමුල්ල

2017 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණයේ 2017 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති භාණ්ඩ 2018.10.19 වැනි සිකුරාදා දින ප. ව. 2.30ට බත්තරමුල්ල ළමා මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත උපලේඛනයේ සඳහන් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා 2018.10.17 පෙ. ව. 10.00 සිට ප. ව. 2.00 දක්වා කාලය තුල පරීක්ෂා කර බැලිය හැකිය.

02. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථා වලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය මෙම අධිකරණය සතුය.

03. වෙන්දේසියේදී මිලදී ගන්නා සියලුම භාණ්ඩ සඳහා එම අවස්ථාවේදීම මුදලින් ගෙවීම කළ යුතු අතර, චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය කිසිසේත් භාර ගනු නොලැබේ.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේදීම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. එලෙස එදිනම ඉවත් කර නොගන්නා භාණ්ඩ සම්බන්ධයෙන් වගකීම දරනු නොලැබේ.

05. වෙන්දේසියේදී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කිරීම අනිවාර්ය වේ.

06. මේ සම්බන්ධයෙන් පැනනගින ගැටලුකාරී තත්ත්වයකදී ආයතන ප්‍රධානියාගේ තීරණය අවසන් තීරණය වේ.

මහෙස්ත්‍රාත්,
ළමා මහෙස්ත්‍රාත් අධිකරණය,
බත්තරමුල්ල.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින,
බත්තරමුල්ල ළමා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

1.	ඡායා පිටපත් යන්ත්‍ර	02	Konica 3231 Cannon NP 1010
2.	පාදාස්තල විදුලි පංකා	01	(වෙළඳ නාමය හඳුනාගත නොහැකි)
3.	පරිගණක මොනිටර්	01	HP
4.	අල්මාරි (වානේ)	01	Grip
5.	විදුලි කේතල	01	Sanyo
6.	යතුරු ලියන (සිංහල/ ඉංග්‍රීසි)	02	Olivetti
7.	සිවිලිං විදුලි පංකා	04	Xcella
8.	වායු සමීකරණ යන්ත්‍ර	02 BTU/ Hr.	Frostaire 36000

09-849

මහාධිකරණය - මාතර

2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදලව ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර මහාධිකරණයේ 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදළව ඉවත් කරන ලද පහත උපලේඛනයේ දැක්වෙන භාණ්ඩ 2018 ඔක්තෝබර් මස 31 වැනි දින ප. ව. 2.00 ට මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 01 කට පෙර නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලීමට මහජනයාට ඉඩ දෙනු ලැබේ.

03. වෙන්දේසියේ මිළ දී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර සියළුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. චෙක්පත් හෝ මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.

04. තක්සේරු මණ්ඩලය විසින් නියම කරන ලද අවම ලංසුව නොපිළිග ැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය අනුව එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ භාණ්ඩ මිල දී ගන්නා අවස්ථාවේ දී තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියැදුරු බලපත්‍රය රැගෙන ආ යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ සියල්ල අධිකරණ භූමියෙන් ප. ව. 4.00 ට පෙර ඉවත් කළ යුතු ය.

අජිත් එම්. මාසිංහ,
මහාධිකරණ විනිසුරු,
දකුණු පළාත්බද මහාධිකරණය,
මාතර.

2018 සැප්තැම්බර් මස 12 වැනි දින,
මාතර මහාධිකරණයේ දී ය.

වෙන්දේසි බඩු ලේඛනය

අනු. අංකය	භාණ්ඩ විස්තරය	ඒකක ප්‍රමාණය
1.	පෙන්ඩියුලන් වර්ගයේ ඔරලෝසුව (භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතී)	01
2.	ඩස්බින් (වේවැල්) 02යි. දිරාපත්ව ඇත	02
3.	1117839 අංක දරන ගොඩ්රිජ් වර්ගයේ සිංහල යතුරුලියනය (අබලන්ව ඇත)	01
4.	1118369 අංක දරන ගොඩ්රිජ් වර්ගයේ සිංහල යතුරු ලියනය (අබලන්ව ඇත)	01
5.	1118375 අංක දරන ගොඩ්රිජ් වර්ගයේ සිංහල යතුරු ලියනය (අබලන්ව ඇත)	01
6.	1121822 අංක දරන ගොඩ්රිජ් වර්ගයේ සිංහල යතුරු ලියනය (අබලන්ව ඇත)	01
7.	1117874 අංක දරන ගොඩ්රිජ් වර්ගයේ සිංහල යතුරු ලියනය (අබලන්ව ඇත)	01
8.	අබලන් වූ පා පැදි දෙකක කොටස්	02
9.	දිරා යාමට ලක් වී ඇති කැබිනට් ෆෝ ඩ්‍රෝවර්	01
10.	දිරා යාමට ලක් වී ඇති කැබිනට් ෆෝ ඩ්‍රෝවර්	01
11.	දිරා යාමට ලක් වී ඇති කැබිනට් ෆෝ ඩ්‍රෝවර්	01
12.	දිරා යාමට ලක් වී ඇති කැබිනට් ෆෝ ඩ්‍රෝවර්	01
13.	කැඩී විනාශ වී ඇති කම්පියුටර් පුටුවල කොටස්	06
14.	ඇඳි කැඩී ඇති පුටුවල කොටස්	03
15.	පුටුවේ පිටුපස කොටස් කැඩී ඇති පුටු	02
16.	දැල් කැඩී ඇති පුටුව	01
17.	නිල් පැහැති දම්රෝ විධායක පුටුව	01
18.	එක් කකුලක් කැඩී ඇති ඇඳි රහිත පුටුව	01
19.	කැඩී ඇති ඇඳි රහිත පුටුව	01
20.	කැඩී ඇති ඇඳි රහිත පුටුව	01
21.	යතුරු ලියන මේසයට භාවිතයට ගන්නා ලී පුටුව (භාවිතයට ගත නොහැක)	01
22.	නෙමිකෝ වර්ගයේ භාවිතයට ගත නොහැකි කබඩ් එක	01
23.	ඇල්ෆා වර්ගයේ භාවිතයට ගත නොහැකි කබඩ් එක	01
24.	වර්ගය පැහැදිලි නැති භාවිතයට ගත නොහැකි වානේ කබඩ් එක	01
25.	ඇල්ෆා වර්ගයේ දිරාපත් වූ වානේ කබඩ් එක	01
26.	එවරෝ වර්ගයේ භාවිතයට ගත නොහැකි කබඩ් එක	01
27.	වර්ගය පැහැදිලි නැති භාවිතයට ගත නොහැකි වානේ කබඩ් එක	01
28.	වර්ගය පැහැදිලි නැති භාවිතයට ගත නොහැකි වානේ කබඩ් එක	01
29.	වර්ගය පැහැදිලි නැති භාවිතයට ගත නොහැකි වානේ කබඩ් එක	01
30.	ලිපිකරු මේසය භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතී	01
31.	ලිපිකරු මේසය එක් කකුලක් දිරාපත්ව ඇත	01
32.	ලිපිකරු මේසය භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතී	01
33.	කණ්නාඩි භාවිතයට ගත නොහැකි මට්ටමෙ පවතී (නාන කාමර)	02
34.	ඡායා පිටපත් යන්ත්‍රය තබන ස්ටෑන්ඩ් (භාවිතයට නොගනී)	01
35.	දැල් කැඩී ඇති ස්ටූල්	02
36.	අබලන් තත්ත්වයේ පවතින වානේ පරිගණක මේසය	01
37.	අබලන් තත්ත්වයේ පවතින පරිගණක මේසය	01
38.	භාවිතයට ගත නොහැකි සාමාන්‍ය මේසය	01
39.	භාවිතයට ගත නොහැකි සාමාන්‍ය මේසය	01
40.	භාවිතයට ගත නොහැකි සාමාන්‍ය මේසය	01
41.	ටෙලිසොනික් වර්ගයේ භාවිතයට ගත නොහැකි සිටුවන පංකාව	01
42.	ඩෙක් වර්ගයේ භාවිතයට ගත නොහැකි සිටුවන පංකාව	01
43.	සිසිල් වර්ගයේ භාවිතයට ගත නොහැකි සිටුවන පංකාව	01
44.	වර්ගය පැහැදිලි නැති සිටුවන පංකාව	01
45.	(21) FRZ 37324 දරන Cannon වර්ගයේ භාවිතයට ගත නොහැකි ඡායා පිටපත් යන්ත්‍රය	01
46.	Konica 3231 වර්ගයේ භාවිතයට ගත නොහැකි ඡායාපිටපත් යන්ත්‍රය	01
47.	03011358 අංක දරන භාවිතයට ගත නොහැකි රෝනියෝ යන්ත්‍රය	01
48.	SNT වර්ගයේ 081090221 - 0097 අංකය දරන UPS	01
49.	P CUPTM වර්ගයේ 0312050111579 අංකය දරන UPS	01
50.	P LUPTM වර්ගයේ 0312050111577 අංකය දරන UPS	01
51.	SLA 0012028 අංකය දරන SNT වර්ගයේ UPS	01
52.	0312050111580 අංකය දරන PCPTME වර්ගයේ UPS	01
53.	61A149723A අංකය දරන Netpro වර්ගයේ UPS	01
54.	00043170 -550 -070 අංකය දරන Intel වර්ගයේ භාවිතයට ගත නොහැකි CPU	01
55.	KHAFBPG අංකය දරන IMB වර්ගයේ භාවිතයට ගත නොහැකි CPU	01
56.	Intel වර්ගයේ 00043 - 170 - 741 - 347 දරන භාවිතයට ගත නොහැකි CPU	01
57.	Intel වර්ගයේ 1588 - 2153 දරන භාවිතයට ගත නොහැකි CPU	01
58.	Samsung වර්ගයේ 200240VAC50/60H2 දරන භාවිතයට ගත නොහැකි CPU	01
59.	Atlantis වර්ගයේ භාවිතයට ගත නොහැකි CPU	01
60.	භාවිතයට නොගන්නා කී බෝඩ්	09
61.	අබලන්ව ඇති නීතිඥ මේසය	01

09-810

රජයේ නොවන දැන්වීම්

සී/ස ලංකා ඔරික්ස් ප්‍රොජෙක්ට් ඩිවලොප්මන්ට් සමාගම
(P B 153)

ණය හිමියන් විසින් ස්වෙච්ඡාවෙන් ඈවර කිරීම

ණය හිමියන්ගේ අවසාන රැස්වීම පිළිබඳ දැනුම් දීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 341 (2) වගන්තියට අනුකූලව මෙමගින් දැනුම් දෙන පරිදි ඉහත නම් සඳහන් සමාගමේ ණය හිමියන්ගේ අවසාන රැස්වීම 2018 ඔක්තෝබර් මස 15 වැනිදා පෙ. ව. 10.00 ට අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ දී පහත අරමුණු උදෙසා පැවැත්වේ.

නිමාවට පත් කිරීමේ ක්‍රියාවලිය සහ එම කාලය තුළ ක්‍රියාකාරකම්, ගිණුම් සහ ගනුදෙනු පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම.

කේ. ඒ. කේ. පී. ගුණවර්ධන,
නීතිඥ,
ඈවරකරු.

අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.
2018 අගෝස්තු මස 30 වැනි දින.

09-672

ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ අපි විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පී බී 878
සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 851, දෙස්තර ඩැනිස්ටර් සිල්වා මාවත, කොළඹ 14
සමාගමේ අලුත් නම : ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ්
සමාගමේ නම වෙනස් වූ දිනය : 2018 සැප්තැම්බර් මස 3 වැනිද

මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල්
(පීවීටී) එල්ටීඩී
සමාගම් ලේකම්වරුන්.

2018 සැප්තැම්බර් මස 6 වැනි ද.

09-678

විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වව්නියාව ප්‍රසිද්ධ නොතාරිස් මයිල්වාගනම් සුදර්ශිනි මහත්මිය විසින් 2017.08.17 වැනි දින අංක 537 දරන ඇටර්නි බලපත්‍රය මගින් ලියා සහතික කරන ලද, යාපනය දිස්ත්‍රික් ලේකම් ජනරාල් කාර්යාලයේ පත් ඉරු 105/29 යටතේ 2017.09.04 වැනි දින ලියාපදිංචි කරන ලද වව්නියාව, මාරම්බෙයිකුලම් 04 වන පටුමග, කණ්තාර්යිත්තකුලම් හි පදිංචි සෙල්ලන් සෙල්වේන්දිරන් (ජා. හැ. පත් අංක 633582041 V) වෙත පවරන ලද විශේෂ ඇටර්නි බලය 2018.09.28 වැනි දින සිට අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට මෙයින් දන්වා සිටිනු ලැබේ.

අප්පුතුරෙ සිවනේසන්,
ජාතික හැඳුනුම්පත් අංක 601261588 V

09-680

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : පමලු ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00203056
සංස්ථාගත කළ දිනය : 2018.08.13
ලිපිනය : අංක 4, ජයන්තිපුර ප්‍රධාන පාර, බත්තරමුල්ල.

සමාගම් ලේකම්.

09-683

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහ ජනතාවට දැනුම් දෙන වග නම්, ඕස්ට්‍රේලියා NSW 2146, තෝන්ගාබි, මෙටල්ලා පාර, අංක 151 දරන ස්ථානයේ පදිංචි පිලිප් තිරුනම්බි කමලනාදන් සහ ධර්මිනි පිලිප් තිරුනම්බි විවාහයට පෙර සිවප්‍රකාසම් වන අපි ඕස්ට්‍රේලියාවේ NSW ප්‍රාන්තයේ දී සාමවිනිසුරු වන ඔස්බෝන් ඉන්ප්‍රරාජා රාජතුරෙයි ඉදිරියේ දී වර්ෂ 2014 ක් වූ ජනවාරි මස 26 වැනි දින ලියා අත්සන් කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 06, පීටර්සන් පටුමග, අංක 62/1 ඒ පදිංචි ජයකුමාර් තංගවේලු (ජා. හැ. පත් අංක 473482797V) යන අයට දෙන ලද ඇටෝර්නි බලපත්‍රය අපි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරමු.

තවද, ඔහු විසින් මින් ඉදිරියට සිදු කරන කිසිම ක්‍රියාවකට, බලයකට, ඔප්පුවකට හෝ කරුණකට වග නොකියන බව ද අපි මෙයින් දන්වා සිටිමු.

1. පිලිප් තිරුනම්බි කමලනාදන්
2. ධර්මිනි පිලිප් තිරුනම්බි විවාහයට පෙර සිවප්‍රකාසම්.

09-686

නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගම් නාමය : මැක් ගේට්ස් ඉංජිනියරින් ඇන්ඩ් බිස්නස් සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 00203847
සංස්ථාපනය කරන ලද දිනය : 2018 සැප්තැම්බර් 05
ලියාපදිංචි කාර්යාලය : අංක 322/3, මාලසිංහගොඩ පාර, උතුරු හෝකන්දර, හෝකන්දර

මැක් ගේට්ස් ඉංජිනියරින් ඇන්ඩ් බිස්නස්
දේපළට පිවිසීම.- හැටන් නගරයේ සිට කොළඹ - ගිණිගත්හේන මාර්ගයේ කි. මී. 5 ක පමණ දුරක් ගොස් වුඩ්ලන්ඩ් බසාර් දක්වා පැමිණි විට පිහිටි 68/4 දරන බෝක්කුව අසළින් දකුණු පසට ඇති වුඩ්ලන්ඩ් වත්තට පිවිසෙන මාර්ග යට හැරෙන්න. එම මාර්ගයේ තවත් කි. මී. 1/2 පමණ දුරක් ගිය විට මාර්ගය අවසානයේ අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2017.07.07 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2017.06.30 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2017.06.27 වැනි දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1000 6. සියලුම ප්‍රචාරක වියදම්. 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නු, නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03,

දුරකතන අංක : 011-2456478, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව,
දුරකතන අංක : 011-3068185, 011-2572940.

09-858

සෙලාන් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පණතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ මීගමුව සිය ලියාපදිංචි අංක පීවී 101725 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන රිච්චින් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට) ලිමිටඩ් යන අය බන්ධනදයි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ, කෙහෙල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, වෝඩ් 18 හි කෙහෙල්වත්ත ශාන්ත සෙබස්තියන් ඇල සහ සාන්චිආරච්චිවත්ත අතර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බාලසුබ්‍රමනියම් විසින් සාදන ලද 2006.07.25 දිනැති අංක 254 දරන සැලැස්මේ නිරූපනය වන සාන්චිආරච්චිවත්ත වරිපනම් අංක 66/1, 66/2, 66/3, 66/4 දරන මහවත්ත නමින්ද හඳුන්වනු ලබන සාන්චිආරච්චිගේ වත්ත නැමති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙද ා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් තිස්දෙකයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 32.40) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2018 ඔක්තෝබර් මස 18 වැනි දින පෙරවරු 9.30 ට එම දේපලළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- පිටකොටුව සිට ඕල්කට් මාවත ඔස්සේ පැමිණ වම්පසට ඇති මරදන පාරට හැරී තවත් මීටර් 200 ක පමණ දුරක් ගොස් සාන්ත සෙබස්තියන් කන්ද වටරවුම දක්වා පැමිණ දකුණු පසට ඇති සාන්චිආරච්චිවත්ත දෙසට හැරී තවත් මීටර් 150 ක පමණ දුරක් ගියවිට අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ 2018.08.03 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.07.26 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.07.31 වැන දින පළ වී ඇති.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්). 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1000, 6. සියලුම ප්‍රචාරක වියදම් 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.- නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.
දුරකතන අංක : 011-2456465, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව,
දුරකතන අංක : 011-3068185, 011-2572940.

09-859

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
මොරටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී (ලියාපදිංචි අංක පී. කිව් 116) මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහනගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි වසමේ වෝඩ් අංක 36 (කුරුඳුවත්ත) වෝඩ් පෙදෙස ඔස්සේ හි පිහිටි වෝඩ් පෙදෙස වරිපනම් අංක 30 දරන පරිශ්‍රයේ ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් 1992 ඔක්තෝබර් 21 දින මැන සාදන ලද අංක 3664A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A2 ප්‍රමාණය පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ ඒ තුළපිහිටි සියලු දේත් සමග වේ. ශ්‍රී ලංකා රජය යටතේ සංස්ථාපිත නිත්‍යානුකූල සමාගමක් වන කොළඹ07, ඉන්ඩිපෙන්ඩන්ස් ඇවනියු, 1 වන මහලේ අංක 07. දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ඉන්ඩිපෙන්ඩන්ස් ආකිටෙක්චරල් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු සහ මාධව සංජීව වත්තේගම උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පිඑල්සී හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 22 වන දින පෙ.ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.06.01 වැනි දින රජයේ ගැසට් පත්‍රයද 2018.06.07 වැනි දින ලක්බිම ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2018.09.28 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද 2018.10.01 වන දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම.- ටවුන් හෝල් හංදියේ සිට වෝඩ් පෙදෙසෙහි මීටර් 150 ක් පමණ ගොස් දකුණට හැරුණුවිට තිබෙන අඩි 20 ක් පමණ පළල පාරේ මීටර් කිහිපයක් ගමන් කළ විට අදාළ දේපළ එම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) 02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) 03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) 04. නොතාරිස් ගාස්තුව රු. 2000, 05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුල දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ මොරටුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරික්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12,
දුරකථන - 011-2445393/011-2396520
ෆැක්ස් :011-2445393
ඊමේල් :senaservice@sltnet.lk/seiservice84@gmail.com.

ජ්‍යෙෂ්ඨ කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 766,
ගාලු පාර, ඉඩම
මොරටුව
දුරකථන 011-2643084
ෆැක්ස් : -011-2643087

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

09-884

සංශෝධනයයි

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2018.09.07 වැනි දින පළකරන ලද අංක 2088 දරන ගැසට් පත්‍රයේ නිවේදන අංක 09 - 181/2 යටතේ පළවූ වෙන්දේසි නිවේදනයේ ඩබ්ලිව්. ඒ. කේ. ඩී. ටී. කාන්චනා සහ ආර්. ටී. කුරුප්පුආරච්චි යන අයගේ ගිණුම් අංකය 0224 5000 0817 ලෙස වැරදියට මුද්‍රණය වී ඇත. එම ගිණුම් අංකය 0224 5000 0187 ලෙස නිවැරදි විය යුතු ය.

උපුල් ගුණතිලක,
කළමනාකරු (අයකර ගැනීම්)

2018 සැප්තැම්බර් මස 14 වැනි දින.

09-896

I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2018 අංක 804

MOD/DEF/03/02/6/5.

ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීමක්

2017 මාර්තු මස 01 වැනි දින සිට කපිතාන් (එච්) වශයෙන් :

කොමාණ්ඩර් (එච්) [තාවකාලික කපිතාන් (එච්)] විජේසූරිය මුදියන්සේලාගේ කෝසල බණ්ඩාර විජේසූරිය, ආර්එස්පී*, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0782

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

09 - 853

2018 අංක 805

MOD/DEF/03/02/RET/340.

ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැන්වීමක් සහ නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2018 ජූලි මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැන්වීම සහ එදින සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (සංඥා) රන්සාධිපතිගේ ඇන්තනී වීරසිංහ, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0988

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

09 - 855

2018 අංක 806

MOD/DEF/03/02/8/7.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීම්

2018 මැයි මස 15 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (මැරීන්) වශයෙන් :

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (මැරීන්)] වලිමුණි වලව්වේ ප්‍රභාත් මිලින්ද බණ්ඩාර දෙහිගම, එන්ආර්වයි 2375, ශ්‍රීලංනාහ

2018 මැයි මස 16 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :

ලුතිනන් (වි) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි)] දෙවරා හන්දි ධනුෂ්ක කුමාර, එන්ආර්එල් 2387, ශ්‍රීලංනාහ

2018 මැයි මස 22 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] අරුණ කෝසල පතිරණ හේවගේ, එන්ආර්එක්ස් 2350, ශ්‍රීලංනාහ
ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] පොන්වීර ආරච්චිලාගේ බුද්ධික කැලුම් රණසිංහ, එන්ආර්එක්ස් 2353, ශ්‍රීලංනාහ
ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] රණසිංහ හෙට්ටිආරච්චිගේ සුරංග සම්පත් රණසිංහ, එන්ආර්එක්ස් 2362, ශ්‍රීලංනාහ

2018 මැයි මස 29 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :

ලුතිනන් (නාසෙ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ)] හිද්දාදුර චාලුක අයස්මන්ත ලංකාරපුර මෙන්ඩිස්, එන්ආර්පි 2376, ශ්‍රීලංනාහ

2018 මැයි මස 31 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] ජයසිංහ ආරච්චිලාගේ උපුල් චමින්ද ජයසිංහ, එන්ආර්එක්ස් 2396, ශ්‍රීලංනාහ

2018 ජුනි මස 19 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (මැරීන්) වශයෙන් :

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (මැරින්)] වීරසිංහ ආච්චිල්ලාගේ අමිත් දර්ශන වීරසිංහ, එන්ආර්වයි 2380, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

09 - 852

2018 අංක 807

MOD/DEF/03/02/8/7.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2018 ජූලි මස 10 වැනි දින සිට ලුතිනන් කොමාන්ඩර් (ස්වේ) වශයෙන් :

ලුතිනන් (ස්වේ) හොඳමුනි දේවේන්ද්‍ර රුෂාන් මැන්ඩිස් කරුණාරත්න, එන්වීටී 5430, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

09 - 854

2018 අංක 808

MOD/DEF/03/02/8/7.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2018 ජනවාරි මස 20 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් සමිත් චතුරංග වීරරත්න ජයසූරිය, එන්ආර්එක්ස් 2642, ශ්‍රීලංනාහ

2018 පෙබරවාරි මස 17 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් ගින්තොට මාන වඩුගේ මිලාන් මානවඩු, එන්ආර්එක්ස් 2640, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

09 - 850

2018 අංක 809

MOD/DEF/03/02/8/7.

ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2018 මැයි මස 05 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාන්ඩර් (නැබ) වශයෙන් :

ලුතිනන් (නැබ) උදය ප්‍රියංග බණ්ඩාර ගලගොඩ, එන්ආර්එච් 2562, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

09 - 856

2018 අංක 810

MOD/DEF/03/02/RES/304.

ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2018 ජුනි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

උප ලුතිනන් (සිඉ) රාජරත්නම් නිරන්ජන්, එන්ආර්සී 3714, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2018 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

09 - 851

රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/26/2018/පිටු/සැ.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2018.09.28 වැනි දින සිට 2018.10.12 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2018.10.19 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර	ඉඩම්වල විස්තර	ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර	
කොළඹ දිස්ත්‍රික්කයේ, දේල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ	බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, වටරප්පල - ටෙම්පලර් පාර ගමේ පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමේ කැබලි අංක සී 2 දරන කැබැල්ලට	01. ඒ. වී. පී. ජෝසප් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1981.07.31 වැනි දින අංක 1785 දරන තෑගිකරය	02. දිනපොත් අංක 10884/2010.03.16 වැනි දින දරන කේවියට් තහනම

එම් කොට්ඨාසයේ 1324 වෙළුමේ 178ඒ පත්ඉරුව

බලයලත් මානක අයි. ඩබ්. ප්‍රනාන්දු මහතා විසින් 1954.01.18 වැනි දින මැන සාදන ලද අංක 1249 සඳහා මායිම්,

උතුරට : මෙම ඉඩමේ ලොට් සී 01.
නැගෙනහිරට : ටෙම්පලර්ස් පෙදෙස,
දකුණට : ව.අ. 11/1, ටෙම්පලර්ස් පාර,
බස්නාහිරට : අඩි පාර.

ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 34.30

09 - 704

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

සන්නස්ගම කරව්වේ මහින්ද සරත් අබේකෝන්.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුජේක්ෂලී කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1552 සහ 2014 සැප්තැම්බර් මස 19 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය, ඉහත කී සන්නස්ගම කරව්වේ මහින්ද සරත් අබේකෝන් විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායි සහ උකස්කරු වශයෙන් ක්‍රියාකරමින් ඉහත කී සන්නස්ගම කරව්වේ මහින්ද සරත් අබේකෝන් විසින් කොළඹ 02, යුනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද,

එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත ආපසු ගෙවීම ඉහත කී සන්නස්ගම කරව්වේ මහින්ද සරත් අබේකෝන් විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව, වාර ණය පහසුකම නිසා 2018.01.28 වැනි දිනට රුපියල් දෙකෝටි නවලක්ෂ අනූපන් දහස් නවසිය අනූවකුත් ශත හැත්තෑපහක (රු. 20,995,990.75) මුදල සහ වාර ණය පහසුකම් මත හිඟ මුල් මුදල වන රුපියල් එක්කෝටි හැත්තෑ එක් ලක්ෂ දහඅට දහස් හාරසිය හැත්තෑ හතකුත් ශත අසූතුනක (රු. 17,118,477.83) මුදල මත එකඟ වූ පරිදි 2018.01.29 වැනි දින සිට තව දුරටත් පොළිය ද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා සහ/හෝ එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරළයේ, උඩුවග්ගම් පත්තුවේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාව තුළ දෙනගම ග්‍රාම නිලධාරි වසමේ. දෙනගම ගමේ පිහිටි, දෙනගම එස්ටේට් (කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. යූ. එස්. කේ. වික්නරාජා විසින් මැන සාදන ලද අංක 2012/612 සහ 2012 අගෝස්තු මස 06 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක 1 දරන බිම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පාර සහ කැබලි අංක 2 ද, බස්නාහිරට : පාර, කැබලි අංක 2 සහ එම ඉඩමේම ඉතිරි කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2012/612 දරන පිඹුර අනුව රූඩ් දෙකකුත් පර්චස් විසිහයයි දශම හයයි තුනක් (අ. 0, රූ. 02, පර්. 26.63) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිල්ල, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපළ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 162/236 දරන වේළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, බලයලත් මිනින්දෝරු කේ. යූ. එස්. කේ. වික්නරාජා විසින් මැන සාදන ලද අංක 2012/612 සහ 2012 අගෝස්තු මස 06 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 2 වශයෙන් ලකුණු කරන ලද පාර සඳහා වෙන් කිරීම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් එවැනි අයිතිවාසිකම් ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

09 - 707

සෙලාන් බැංකුව පීඑල්සී - පිළිමතලාව ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 1580 - 35362230 - 001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.07.25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. කේ. නවරරත්න විසින් සියල්ල සහතික කරන ලද 2017 ජූනි මස 13 දිනැති ප්‍රාරම්භික උකස් බැඳුම්කර අංක 2002, අතිරේක උකස් බැඳුම්කර අංක 2003 යන දෙකම සහ 2018 ජනවාරි මස 23 දිනැති අංක 2082 දරන අතිරේක උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පිළිමතලාව පදිංචි බෙත්ගේ ගෙදර සංජීව බණ්ඩාර පල්ලෙවත්ත යන අය බන්ධනදායී වශයෙන් රුපියල් තුන්කෝටි එකොළොස් ලක්ෂ පනස් නවදහස් දෙසීය නවයයි ශත දොළහක (රු. 31,159,209.12) මුදලක්, එකී බැඳුම්කර මත පහත සඳහන් පහසුකම් සම්බන්ධයෙන් පොළිය සමග 2018 මාර්තු මස 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුල් මුදල සහ පොළිය වන රුපියල් තුන්කෝටි එකොළොස් ලක්ෂ පනස්නව දහස් දෙසීය නවයයි ශත දොළහක (රු. 31,159,209.12), 2018 මාර්තු මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා පහත සඳහන් කරන පරිදි එකී පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී අංක 2002, 2003 සහ 2082 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) වාර ණය I පහසුකම සම්බන්ධයෙන් රුපියල් අනූහත් ලක්ෂ හතළිස් හතර දහස් අටසිය පනස් හයයි ශත විසි තුනක (රු. 9,744,856.23) මුදලක් මත 2018 මාර්තු මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහහත (17%) බැගින් පොළිය සමග රුපියල් එක්කෝටි හාර ලක්ෂ අනූ දහස් තුන්සිය තිස් හතරයි ශත අසූ තුනක (රු. 10,490,334.83 මුදලක්.

(ආ) වාර ණය II පහසුකම සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි හතළිස් ලක්ෂයක (14,000,000) මුදලක් මත 2018 මාර්තු මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහහත (17%) බැගින් පොළිය සමග රුපියල් එක්කෝටි පනස් ලක්ෂ පනස් හතර දහස් හයසිය අසූවයි ශත විසි නවයක (රු. 15,054,680.29) මුදලක්.

(ඇ) වාර ණය III පහසුකම සම්බන්ධයෙන් රුපියල් පනස් පන් ලක්ෂයක (රු. 5,500,000) මුදලක් මත 2018 මාර්තු මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහහත (17%) බැගින් පොළිය සමග රුපියල් පනස් හය ලක්ෂ දහහතර දහස් එකසිය අනූහතරක (රු. 5,614,194) මුදලක්.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ සහ කඩුගන්නාව මහ නගර සභා සීමාව තුළ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ 172 පිළිමතලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිළිමතලාව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ආර්. අබයකෝන් විසින් සාදන ලද 2017.04.20 දිනැති අංක 3656 දරන සැලැස්මේ නිරූපනය වන අස්වැද්දුමේවත්ත නමින් දැනුවත් සහ නමැති ඉඩමෙන් ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : නානුඔය සහ බ.ම. එස්. කේ. සිරිවර්ධනගේ අංක 4419 සැලැස්මේ සඳහන් ලොට් 03 ද, ගිණිකොණට : අංක 4419 සැලැස්මේ සඳහන් ලොට් 03 සහ මහනුවර - කොළඹ ප්‍රධාන පාර ද, නිරිතට : අංක 4419 සැලැස්මේ සඳහන් ලොට් 2ඒ සහ ලොට් 2 සහ වයඹට : අංක 3656 සැලැස්මේ සඳහන් ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් හයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 6.5) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. හැව් මිය,
දෙපාර්තමේන්තු ප්‍රධානී - නීති.

09 - 813

සෙලාන් බැංකුව පීඑල්සී - පිළිමතලාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද යෝජනාව

ගිණුම් අංක : 1580 - 35362355 - 001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.07.25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 සංශෝධිත පරිදි දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ජේ. කේ. නවරත්න විසින් සියල්ල සහතික කරන ලද 2017 මාර්තු 30 දිනැති ප්‍රාරම්භික අංක 1977, දෙකම 2017 ජූනි මස 13 දිනැති අතිරේක උකස් බැඳුම්කර අංක 1998 සහ ප්‍රාථමික උකස් බැඳුම්කර අංක 2001 මත අයවිය යුතු මුදල් ගෙවීම, කිරිබත්කුඹුර සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක 110653 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන මිලේනියම් ඉන්ජිනියරිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් රුපියල් හැත්තෑ හත් ලක්ෂයක (රු. 7,700,000) මුදලක්, එකී බැඳුම්කර මත වාරණය පහසුකම් සම්බන්ධයෙන් 2018 මාර්තු මස 29 වැනි දින සිට වසරකට සියයට දහහත (17%) බැගින් පොළිය සමග රුපියල් හැත්තෑ නව ලක්ෂ විසිපන් දහස් තුන්සිය විසි එකයි ශත පනස් නවයක (රු. 7,925,321.59) මුදලක් මුල් මුදල සහ පොළිය වශයෙන් 2018 මාර්තු මස 28 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුදල වන රුපියල් හැත්තෑ නව ලක්ෂ විසිපන් දහස් තුන්සිය විසි එකයි ශත පනස් නවයක (රු. 7,925,321.59) මුදලක් 2018 මාර්තු මස 29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා පෙරකී පරිදි එකී පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී අංක 1977, 1998 සහ 2001 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

පළමුවැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැද පළාත් කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරාගම - 180 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරාගම සහ ඉඹුල්මල්ගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. කේ. කේ. ඒකනායක විසින් සාදන ලද 2017.01.10 දිනැති අංක 1203 දරන සැලැස්මේ නිරූපනය වන හපුඅංගේකුඹුර, හපුඅංගෙ ඊවත්ත, හපුඅංගේහේන සහ පිටවලකුඹුර හෙවත් හපුඅංගේකුඹුර නමැති ඉඩම් කොටසේ ලොට් 14 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 15 ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ ලොට් 18 ද, දකුණට : බ.ම. පී. රූපසිංහගේ අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් 10 සහ 11 වෙන් කෙරෙන මෙම සැලැස්මේ ලොට් 17 ලකුණු කළ කාණුව ද සහ බස්නාහිරට : මෙම සැලැස්මේ ලොට් 13 වෙන් කෙරෙන මෙම සැලැස්මේ සඳහන් ලොට් 12 ලකුණු කළ කාණුව ද යන මායිම් තුළ පර්චස් දහහතරක් (අ. 0, රූ. 0, පර්. 14) නොහොත් හෙක්ටයාර 0.0354ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරාගම - 180 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරාගම සහ ඉඹුල්මල්ගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. කේ. කේ. ඒකනායක විසින් සාදන ලද 2017.01.10 දිනැති අංක 1203 දරන සැලැස්මේ නිරූපනය වන හපුඅංගේකුඹුර, හපුඅංගෙ ඊවත්ත, හපුඅංගේහේන සහ පිටවලකුඹුර හෙවත් හපුඅංගේකුඹුර නමැති ඉඩම් කොටසේ ලොට් 15 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නිවෙස්වලට යන පාර වෙන් කෙරෙන මෙම සැලැස්මේ සඳහන් ලොට් 17 ලකුණු කළ කාණුව ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 16 ලකුණු කළ අඩි 10ක් පළල මාර්ග ප්‍රවේශය ද, දකුණට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 14 සහ බස්නාහිරට : මෙම සැලැස්මේ ලොට් 11 ද යන මායිම් තුළ පර්චස් දහයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 10.5) නොහොත් හෙක්ටයාර 0.0265ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරාගම - 180 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරාගම සහ ඉඹුල්මල්ගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. කේ. කේ. ඒකනායක විසින් සාදන ලද 2017.01.10 දිනැති අංක 1203 දරන සැලැස්මේ නිරූපනය වන හපුඅංගේකුඹුර, හවුඅංගෙ ඊවත්ත, හපුඅංගේහේන සහ පිටවලකුඹුර හෙවත් හපුඅංගේකුඹුර නමැති ඉඩම් කොටසේ ලොට් 16 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නිවෙස්වලට යන පාර වෙන් කෙරෙන මෙම සැලැස්මේ සඳහන් ලොට් 17 ලකුණු කළ කාණුව ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 14 සහ බස්නාහිරට : මෙම සැලැස්මේ ලොට් 15 ද යන මායිම් තුළ පර්චස් එකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 1.5) නොහොත් හෙක්ටයාර 0.0038ක් විශාල ඉඩම.

එකී දේපළ පහත සඳහන් ඉඩමේ බෙදූ කොටසක් වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරාගම - 180 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරාගම සහ ඉඹුල්මල්ගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. කේ. කේ. ඒකනායක විසින් සාදන ලද 2016.08.01 දිනැති අංක 1050ඒ දරන සැලැස්මේ නිරූපනය වන හපුඅංගේකුඹුර, හපුඅංගෙවත්ත, හපුඅංගේහේන සහ පිටවලකුඹුර හෙවත් හපුඅංගේකුඹුර නමැති ඉඩම් කොටසේ ලොට් 01 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නිවෙස්වලට යන ගම්සභා පාර සහ අංක 1050ඒ සැලැස්මේ සඳහන් ලොට් 2 ලකුණු කළ කාණුව ද, නැගෙනහිරට සහ ගිණිකොණට : ඒ. පී. ජයරත්න විසින් හිමිකම් කියනු ලබන රන්කොත්ගෙදර වත්ත සහ ලොට් 10, 11 සහ අංක 3541 සැලැස්මේ සඳහන් කාණුව ද, දකුණට සහ නිරිතට : අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් 10, 04, 07, කාණුව සහ වැට සහ බස්නාහිරට සහ වයඹට : අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් 7 සහ නිවෙස්වලට යන ගම්සභා පාර, වැට සහ කාණුව ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසිහතරක් (අ. 0, රූ. 03. පර්. 24) පර්චස් 5ක් පළල සමග අංක 1050ඒ සැලැස්මේ සඳහන් ලොට් 2 ලකුණු කළ මාර්ගය 1 1/2ක් පළල සහ ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

දෙවැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරාගම - 180 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරාගම සහ ඉඹුල්මල්ගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. කේ. කේ. ඒකනායක විසින් සාදන ලද 2017.01.10 දිනැති අංක 1203 දරන සැලැස්මේ නිරූපනය වන හපුඅංගේකුඹුර, හපුඅංගෙ ඊවත්ත, හපුඅංගේහේන සහ පිටවලකුඹුර හෙවත් හපුඅංගේකුඹුර නමැති ඉඩම් කොටසේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 1 සහ ලොට් 4 ද, නැගෙනහිරට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 4 සහ 6 ද, දකුණට : බ.ම. පී. රූපසිංහගේ අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් 4 වෙන් කෙරෙන මෙම සැලැස්මේ සඳහන් ලොට් 17 ලකුණු කළ කාණුව ද සහ බස්නාහිරට : බ.ම. පී. රූපසිංහගේ අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් ද යන මායිම් තුළ පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) නොහොත් හෙක්ටයාර 0.0381ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරාගම - 180 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරාගම සහ ඉඹුල්මල්ගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. කේ. කේ. ඒකනායක විසින් සාදන ලද 2017.01.10 දිනැති අංක 1203 දරන සැලැස්මේ නිරූපනය වන හපුඅංගේකුඹුර, හවුඅංගෙ ඊවත්ත, හපුඅංගේහේන සහ පිටවලකුඹුර හෙවත් හපුඅංගේකුඹුර නමැති ඉඩම් කොටසේ ලොට් 4 ලකුණු කළ බෙදා වෙන් කල මාර්ගයට මායිම්, උතුරට : නිවෙස්වලට යන පාර වෙන් කෙරෙන මෙම සැලැස්මේ සඳහන් ලොට් 17 ලකුණු කළ කාණුව ද, නැගෙනහිරට 5 සහ ලොට් 6 ද, දකුණට : මෙම සැලැස්මේ සඳහන් ලොට් 2 වෙන් කෙරෙන ලොට් 3 ලකුණු කළ කාණුව ද සහ බස්නාහිරට : සැලැස්මේ සඳහන් ලොට් 1 සහ ලොට් 3 වෙන කෙරෙන ලොට් 3 ලකුණු කළ කාණුව ද යන මායිම් තුළ පර්චස් එකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 1.5) නොහොත් හෙක්ටයාර 0.0038ක් විශාල, මාර්ගය.

ඉහත සඳහන් දේපළ පහත සඳහන් ඉඩමේ අතුරු බෙදීමක් වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගිරාගම - 180 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගිරාගම සහ ඉඹුල්මල්ගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. කේ. කේ. ඒකනායක විසින් සාදන ලද 2016.08.01 දිනැති අංක 1050ඒ දරන සැලැස්මේ නිරූපනය වන හපුඅංගේකුඹුර, හවුඅංගෙ වත්ත, හපුඅංගේහේන සහ පිටවලකුඹුර හෙවත් හපුඅංගේකුඹුර නමැති ඉඩම් කොටසේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : නිවෙස්වල සිට පිළිමතලාව - දොඩන්වල පාරට යන පාර සහ අංක 1050ඒ සැලැස්මේ සඳහන් ලොට් 2 ලකුණු කළ කාණුව ද, නැගෙනහිරට සහ ගිණිකොණට : අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් 10, 11, ඒ. පී. ජයරත්නට හිමි රන්කොත්ගෙදර වත්ත සහ කාණුව ද, දකුණට සහ නිරිතට : අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් 10, 4, 7 සහ වැට සහ බස්නාහිරට සහ වයඹට : නිවෙස්වල සිට පිළිමතලාව - දොඩන්වල පාරට යන පාර, අංක 3541 සැලැස්මේ සඳහන් ලොට් 7, වැට, අංක 1050ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ලකුණු කළ අඩි 1 1/2ක් පළල පර්චස් 5ක කාණුව ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසිහතරක් (අ. 0, රූ. 03, පර්. 24) විශාල, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. හැච් මිය,
දෙපාර්තමේන්තු ප්‍රධානී - නීති.

09 - 814

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ඒ. පි. හෙට්ටිආරච්චි සප්ලයර්ස්.
ණය ගිණුම් අංකය - 2137940.

2018 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එෆ්. ඊ. එස්. ප්‍රනාන්දු විසින් 2009 නොවැම්බර් මස 30 වැනි දින සහතික කරන ලද අංක 7182, 2010 නොවැම්බර් මස 24 වැනි දින සහතික කරන ලද අංක 7716, 2011 ජූලි මස 27 වැනි දින සහතික කරන ලද අංක 8306 සහ 2013 නොවැම්බර් මස 25 වැනි දින සහතික කරන ලද අංක 9509 කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. ඒ. සමරරත්න විසින් 2012 ජූලි මස 24 වැනි දින සහතික කරන ලද අංක 2662 සහ 2015 ජනවාරි මස 20 වැනි දින සහතික කරන ලද අංක 2926 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඒ. පි. හෙට්ටිආරච්චි සප්ලයර්ස් යන වෙළෙඳනාමය යටතේ තනි අයිතිකාර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අනුර ප්‍රියන්ත හෙට්ටිආරච්චි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් අසූ ලක්ෂයක (රු. 8,000,000) මුදලක් 2018 මැයි මස 01 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී (රු. 8,000,000)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2018 මැයි මස 02 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 8,000,000ක මුදල මත 16.25%ක වැඩිදුර පොළියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 7182, 7716, 8306, 2662, 9509 සහ 2926 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූද දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩ්‍රොප් වීදියේ, අංක 200 දරන ස්ථානයේ 2 වන මහලේ, පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහළ මාකොළ දකුණ 271B ග්‍රාම නිලධාරි වසමේ, මාකොළ ගමේ හි පිහිටි දවටගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් 1963 පෙබරවාරි මස 27 වැනි දින මැන සාදන ලද අංක 860 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 9 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ලොට් 10 සහ 11 න් ද, නැගෙනහිරට : ලොට් 8 න් ද, දකුණට : එම්. ඒ. කරුණාතිලකගේ ඉඩමෙන් ද සහ බස්නාහිරට : ජේ. ඒ. ඩී. ආර්. ජයතිලකගේ ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 860 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 20.25) විශාලත්වයෙන් යුක්ත වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉත්ඉරු C 917/230 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ගය මතුපිටින් හා ඒ දිගේ එහා මෙහා යාමේ අයිතිය සමග වේ.

ඉහත කී මාකොළ ගමේ හි පිහිටි දවටගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් 1963 පෙබරවාරි මස 27 වැනි දින මැන සාදන ලද අංක 860 දරන පිඹුරෙන් බෙදා වෙන කරන ලද ලොට් 11 (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : පී. ඩබ්ලිව්. ඩී. පාර සහ මෙම ඉඩමේම ලොට් 10, ලොට් 12 (ඉතිරි ප්‍රදේශය) න් ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 2, 4, 5 සහ 6 න් ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 7 සිට 9න් ද සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 9 සහ 10 සහ ලොට් 1, ලොට් 12 (ඉතිරි ප්‍රදේශය) න් ද මායිම් වූ එකී අංක 860 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිහක (අ. 0, රූ. 0, පර්. 30) විශාලත්වයෙන් යුක්ත වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු C 917/227 යටතේ ලියාපදිංචි කර ඇත.

රන්ජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

09 - 883

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

නුවරඑළිය, ලෝසන් වීදියේ, C 1 කොටසෙහි, සිවාස් සංකීර්ණයෙහි සී/ස සිවාස් පුද්ගලික සමාගමෙහි වගකීම් වෙනුවෙන් උකස් කරන ලද නුවරඑළිය, ලෝසන් වීදිය, C 1 කොටසෙහි සිවාස් සංකීර්ණයෙහි පිහිටි දේපළෙහි බදු අයිතිය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.05.02 වැනි දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජී. සී. පී. තිලකරත්න විසින් සහතික කරන ලද 2014.07.24 දිනැති අංක 3659 දරන උකස් බැඳුම්කරය අනුව ප්‍රතිලේඛනගත ණය මත මුල් මුදල හා 2018.04.05 වැනි දින තෙක් හිඟහිටි පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකොළොස්කෝටි පන් ලක්ෂ පන් දහස් අටසිය තිහයි ශත දහ හතරක (රු. 110,505,830.14) මුදල සමග ප්‍රතිලේඛනගත ණය මුදලෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් අටකෝටි පනස් අට ලක්ෂ විසි හතර දහස් පහළොවයි ශත අනූවක (රු. 85,824,015.90) මුදල මත වසරකට සියයට එකොළහ (11%) බැගින් 2018.04.06 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ගෙවිය යුතු පොළිය නුවරඑළිය, ලෝසන් වීදියේ, C 1 කොටසෙහි සිවා සංකීර්ණයෙහි පිහිටි සී/ස සිවාස් (පුද්ගලික) සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3659 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එකොළොස් කෝටි පන් ලක්ෂ පන්දහස් අටසිය තිහයි ශත දහ හතරක (රු. 110,505,830.14) මුදල සමග 2018.04.06 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට තවදුරටත් අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපලෙහි බදු අයිතිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290හි වෙන්දේසිකාර ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම මහතුන් හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ (අයකර ගැනීම්) ආයතනික අංශයේ සම්බන්ධතා කළමනාකරුට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

පළමු උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, සුළු නුවරඑළිය මහ නගර සභා සීමාවේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535 දරන නුවරඑළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුවරඑළිය කඩවීදියේ අංක 6 වන කොට්ඨාසයේ, කොඩිගහහි පිහිටි එලිසබෙත් රැජින වීදියේ වරිපනම් අංක 41, 43, 45, 47, 49, 51, 53, 55, 57, 59 හා 61 නව කඩවීදියේ 32, 34, 36, 38, 42, 44, 46, 48, 50 (කොටස) 71, 77 සහ ඩෝසන් වීදියේ 4, 6, 8, 12, 32/12, 36, 38, 40, 42, 44, 46, 48, 50 සහ 52 දරන සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද P.P. නු 995 ලොට් 1 සිට 7 දක්වා සහ 12 සිට 16 දක්වා ද P.P. නු 1082 හි ලොට් 1 සිට 7 දක්වා වූ දේපළ ඒකාබද්ධ කර බෙදා වෙන් කරන ලද බලයලත් මිනින්දෝරු ඒ. එස්. බී. විජේකෝන් විසින් සාදන ලද 1987.03.09 දිනැති අංක 10/87 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : එකී අංක 10/87 දරන පිඹුරෙහි ලොට් 8 ද, නැගෙනහිරට : එකී අංක 10/87 දරන පිඹුරෙහි ලොට් 8 ද, දකුණට : එකී අංක 10/87 දරන පිඹුරෙහි ලොට් 3 ද, බස්නාහිරට : එකී අංක 10/87 දරන පිඹුරෙහි ලොට් 9 ද මායිම්ව පර්චස් දාහතයි දශම දෙකයි අටක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 26/196 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල මෑතකදී සාදන ලද මැනුම් පිඹුරකට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කොරළේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුවරඑළිය මහ නගර සභා සීමාවේ නුවරඑළිය නගරයේ පිහිටි ඩෝසන් වීදියේ, වරිපනම් අංක 46, 48, 50, 46/1, 46/2, 46/3, 50/1, 50/2, 50/3, 50/4, 48/1/1, 48/1/2, 48/1/3, 48/1/4, 48/1/5, 48/1/6, 48/1/7, 48/1/8, 48/1/9, 48/1/10 48/2/1 දරන බලයලත් මිනින්දෝරු නිමල් ලියනගේ විසින් සාදන ලද 2013.06.24 දිනැති අංක 1029 දරන පිඹුරෙහි නිරූපිත "සිවා කම්ප්ලෙක්ස්" නමැති ඉඩම් කැබැල්ල උතුරට : ලෝසන් වීදිය හා වෙන් කළ කොටස ද, නැගෙනහිරට : රථගාල ද, දකුණට : කවිතාස් කම්ප්ලෙක්ස් ද, බස්නාහිරට : පාර ද මායිම්ව පර්චස් දාහතයි දශම දෙකයි අටක (අ. 0, රූ. 0, පර්. 17.28) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ.

මේ සමග මෙයට එන අංක 10/87 දරන පිඹුරෙහි දක්වා ඇති ඉදිරිපස පදික ප්‍රදේශය වන ලොට් 8 ප්‍රවේශ මාර්ගයක් ලෙස ද එකී අංක 10/87 දරන පිඹුරෙහි දක්වා ඇති ලොට් 9 වන පොදු සේවා ප්‍රදේශය ප්‍රවේශ මාර්ගයක් හා වාහන ගාල් කිරීමට ද පූර්ණ හා නිදහස් අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සම්බන්ධතා කළමනාකරු.
(අයකර ගැනීම් - ආයතනික)

ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 1, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

09 - 889

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.08.10 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන මහත්මිය විසින් සහතික කරන ලද 2013.08.16 දිනැති අංක 607 දරන අතිරේක උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් දීප්ති වීරසූරිය මහත්මිය විසින් සහතික කරන ලද 2017.04.03 දිනැති අංක 3368 දරන උකස් බැඳුම්කර අනුව 2017.12.11 වැනි දින තෙක් කාලීන ණය පහසුකම මත හිඟහිටි මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි තුන් ලක්ෂ පනස් දහස් පන්සිය දහතුනයි ශත හැත්තෑ දෙකක (රු. 10,350,513.72) මුදල සමග රුපියල් අනූහය ලක්ෂ හැටහය දහස් හයසිය හැට හයක (රු. 9,666,666) මුදල මත වසරකට සියයට දහතුනයි දශම නවයයි තුන (13.93%) බැගින් පොළියක් 2017.12.12 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 12, ගල්වල පාරේ, අංක 55හි හයිටෙක් හාඩ්වෙයාර් සෙන්ටර් (පුද්ගලික) සමාගම (සමාගම් අංකය - PV 87457) වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3368 සහ 607 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් එක්කෝටි තුන් ලක්ෂ පනස් දහස් පන්සිය දහතුනයි ශත හැත්තෑ දෙකක (රු. 10,350,513.72) මුදල සමග 2017.12.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර ටී. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, පිටකොටුව ශාඛාවේ, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩ බුලත්ගම කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ, හැටන් දික්ඔය නගර සභා සීමාව තුළ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 319B හැටන් උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හැටන් පිහිටි හැටන් හවුස් පාරේ, වරිපනම් අංක 62 දරන "ගුණවර්ධන බිල්ඩින්"හි පංගුව නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1991 නොවැම්බර් මස 01 දිනැති අංක 4686A දරන පිඹුරෙහි ලොට් 10 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 10 උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී, වයි. විජේවර්ධන විසින් සාදන ලද 1990 ජූලි මස 10 දිනැති අංක 4686 දරන පිඹුරෙහි ලොට් 8, ලොට් 9 සහ 8 ද හැටන් හවුස් පාර ද, නැගෙනහිරට : හැටන් හවුස් පාර සහ හැටන් හවුස් පාරේ වරිපනම් අංක 22 දරන පරිශ්‍රය ද, දකුණට : හැටන් හවුස් පාරේ වරිපනම් අංක 22 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : ලොට් 4, 7 සහ අංක 4686 දරන පිඹුරෙහි 8 ද මායිම්ව එකී අංක 4686A දරන පිඹුරට අනුව පර්චස් හතරයි දශම අටයි හයක (අ. 0, රූ. 0, පර්. 4.86) හෙවත් හෙක්ටයාර 0.00123ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිල්ල හා සියලු දේ වේ. මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 35/291හි ලියාපදිංචි කර ඇත.

දෙවැනි උපලේඛනය

එකී හැටන් හවුස් පාර දිගට පිහිටි ගුණවර්ධන බිල්ඩින් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1990 ජූලි මස 10 දිනැති අංක 4686 දරන පිඹුරෙහි ලොට් 08 ලෙස දක්වා (පාරට වෙන් කළ කොටස) සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 8 උතුරට : ලොට් 5, 9 සහ 10 හා හැටන් හවුස් පාර ද, නැගෙනහිරට : ලොට් 9, 10, 11, 12, 13, 14 හා 15 ද, දකුණට : ලොට් 1, 5 සහ 07 ද, බස්නාහිරට : ලොට් 7, 6, 5 සහ 4 ද මායිම්ව එකී අංක 4686 දරන පිඹුරට අනුව පර්චස් හයයි දශම හයයි හතරක (අ. 0, රූ. 0, පර්. 06.64) බිම ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 115/22හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. කොඩිතුවක්කු මහතා.
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්).

ලංකා බැංකුව,
පිටකොටුව.

09 - 886

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2017.12.20 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. පෙරේරා මහත්මිය විසින් සහතික කරන ලද 2015.01.21 දිනැති අංක 1513 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී, වීරසූරිය විසින් සහතික කරන ලද 2017.04.03 දිනැති අංක 3367 දරන අතිරේක උකස් බැඳුම්කරය අනුව 2017.12.11 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් තුන්කෝටි හැට දෙලක්ෂ අසූහත් දහස් අටසිය හතළිස් හතරයි ශත හැට නවයක (රු. 36,287,844.69) මුදල සමග රුපියල් දෙකෝටි තිස්හතර ලක්ෂ හැත්තෑ පන් දහස් අටසිය විසිපහයි ශත හැත්තෑ නවයක (රු.23,475,825.79) කාලීන ණය 1 මත වසරකට සියයට දහතුනයි දශම නවයයි තුනක (13.93%) බැගින් ද, රුපියල් අනූහය ලක්ෂ හැටහය දහස් හයසිය හැට හයක (රු. 9,666,666.00) කාලීන ණය 2 මත වසරකට සියයට දහහතරයි දශම බිංදුවයි පහ (14.05%) බැගින් තවදුරටත් පොළිය සහ ණය මාලා 1 පහසුකමෙහි හිඟහිටි මුල් මුදල රුපියල් හැත්තෑදහස (රු. 70,000) මත වසරකට සියයට දහහතරයි දශම නවයයි තුන (14.93%) බැගින් පොළිය ද, ණය මාලා 2 පහසුකමෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් එක් ලක්ෂ හතළිස් නව දහසක (රු. 1,49,000) මුදල මත වසරකට සියයට දහතුනයි දශම නවයයි තුන (13.93%) බැගින් පොළිය ද ණය මාලා 3 පහසුකමෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් එක්ලක්ෂ හැට එක් දහසක (රු. 1,61,000) මුදල මත වසරකට සියයට දහතුනයි දශම නවයයි තුන (13.93%) බැගින් පොළිය ද ණය මාලා 4 පහසුකමෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් තුන් ලක්ෂ හතළිස් දහසක (රු. 3,40,000) මුදල මත වසරකට සියයට දහහතරයි දශම නවයයි තුන (14.93%) පොළිය ද, ණය මාලා 5 පහසුකමෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් අනූ දෙදහසක (රු. 92,000) මුදල මත වසරකට සියයට දහහතරයි දශම නවයයි තුන (14.93%) පොළිය ද, 2017.12.12 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 12, ගල්වල පාරේ අංක 55හි සීමාසහිත හයිටෙක් හාඩ්වෙයාර් සෙන්ටර් (පුද්ගලික) සමාගම (සමාගම් අංකය PV 87457) වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1513 සහ 3367 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් තුන්කෝටි හැට දෙලක්ෂ අසූහත් දහස් අටසිය හතළිස් හතරයි ශත හැට නවයක (රු. 36,287,844.69) මුදල සමග 2017.12.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර ටී. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 සහ 28 වන වගන්ති යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, පිටකොටුව ශාඛාවේ, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

පළමු උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාවේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 478A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කටුමාන ග්‍රාමයෙහි පිහිටි "කටුමාන කැලේ" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් සාදන ලද 2003 මාර්තු මස 25 දිනැති අංක 40/2003 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : අංක 97/1999 දරන පිඹුරෙහි ලොට් 32, ලොට් R5 ද, නැගෙනහිරට : අංක 97/1999 දරන පිඹුරෙහි ලොට් R5, R3 හා 28 ද, දකුණට : ලොට් 28 සහ බලයලත් මිනින්දෝරු බර්නාඩ් පී. රූපසිංහ විසින් සාදන ලද 1996 මාර්තු මස 17 දිනැති අංක 1645 දරන පිඹුරෙහි ලොට් 1 ද, බස්නාහිරට : අංක 1645 දරන පිඹුරෙහි ලොට් 1 සහ ලොට් 32 ද, මායිම්ව එකී අංක 40/2003 දරන පිඹුරට අනුව පර්චස් තිහක (අ. 0, රූ. 0, පර්. 30) හෙවත් හෙක්ටයාර 0.07587ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියලු දේද වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 155/82 හි ලියාපදිංචි කර ඇත.

දෙවැනි උපලේඛනය

1. එකී කටුමාන ග්‍රාමයෙහි දැනට රොස්වුඩ් එස්ටේට් ලෙස ප්‍රසිද්ධ කටුමානවත්ත යැයි ද හඳුන්වන "කටුමාන කැලේ" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බර්නාඩ් පී. රූපසිංහ විසින් සාදන ලද 1996 මාර් මස 17 දිනැති අංක 1645 දරන පිඹුරෙහි ලොට් 4 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට : බදුල්ල - නුවරඑළිය මහා මාර්ගය ද, නැගෙනහිරට හා දකුණට : එකී අංක 1645 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට : ඉඩමට වෙන් කල කොටස ද මායිම්ව එකී අංක 1645 දරන පිඹුරට අනුව පර්චස් දෙකයි දශම එකයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 2.10) බිම ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 87/275 හි ලියාපදිංචි කර ඇත.

2. එකී කටුමාන ග්‍රාමයෙහි පිහිටි "කටුමාන කැලේ" (දැනට උද්‍යානය) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් සාදන ලද 1999 අගෝස්තු මස 25 දිනැති අංක 97/1999 දරන පිඹුරෙහි ලොට් R3 (මීටර් 6 පළල පාරට වෙන්කල කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R3 උතුරට : ලොට් R2 ද, නැගෙනහිරට : ලොට් 17, R4, 26, 27 සහ 28 ද, දකුණට : ලොට් 28 හා 29 ද, බස්නාහිරට : R3, 25 සහ 18 ද මායිම්ව එකී අංක 97/1999 දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම හයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 10.60) හෙවත් හෙක්ටයාර 0.02681ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 87/271හි ලියාපදිංචි කර ඇත.

3. එකී කටුමාන ග්‍රාමයෙහි පිහිටි "කටුමාන කැලේ" (දැනට උද්‍යානය) නමැති ඉඩමේ අංක 97/1999 දරන පිඹුරෙහි ලොට් R5 (මීටර් 6 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් R5 උතුරට : ලොට් 51, R8, 54, 34, 33, 22, 23, 24 සහ 25 ද, නැගෙනහිරට : ලොට් R3 ද, දකුණට : ලොට් 29, 30, 31, 32, D5, 35, 36 සහ R6 ද, බස්නාහිරට : ලොට් 49 හා 50 ද මායිම්ව එකී අංක 97/1999 දරන පිඹුරට අනුව පර්චස් විසි අටක (අ. 0, රූ. 0, පර්. 28) හෙවත් හෙක්ටයාර 0.07082ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 40/248හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙය එකී අංක 97/1999 දරන පිඹුරෙහි R1 හා R2 ලෙස දක්වා ඇති ඉඩම් මතින් සහ ඒ දිගට පාරේ අයිතියද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. කොඩිතුවක්කු,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්).

ලංකා බැංකුව,
පිටකොටුව.

09 - 887

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.08.10 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එම්. බී. ටී. ආර්. සිරිවර්ධන මහත්මිය විසින් සහතික කරන ලද 2014.12.01 දිනැති අංක 186 දරන උකස් බැඳුම්කරය සහ 2014.12.01 දිනැති අංක 187 දරන උකස් බැඳුම්කරය අනුව පළමු ණය මත 2018.06.20 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් දසකෝටි හැට හත් ලක්ෂ අසූඅට්ක දහස් හාරසිය දෙකෙයි ශත පනස්තුනක (රු. 106,781,402.53) මුදල සමග රුපියල් දස කෝටි විසිඑක් ලක්ෂ හතළිස් දහස් එකසිය හැත්තෑ නවයයි ශත හතළිස් පහක (රු. 102,140,179.45) මුදල මත වසරකට සියයට අටයි දශම බිංදුව (8.0%) බැගින් 2018.06.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තව දුරටත් පොළියක් ද දෙවන ණය මත 2018.06.20 වැනි දින තෙක් මුදල් මත හා පොළිය වශයෙන් රුපියල් දෙකෝටි එක් ලක්ෂ දොළොස් දහස් හත්සිය පනස් හතරයි ශත අසූ අටක (රු. 20,112,754.88) මුදල සමග රුපියල් එක්කෝටි අනූ දෙලක්ෂ තිස් අට දහස් නවසිය හැත්තෑ හතරයි ශත හැත්තෑ එකක (රු. 19,238,974.71) මුදල මත වසරකට සියයට අටයි බිංදුව (8.0%) බැගින් 2018.06.21 වැනි දින සිට ගෙවීම් නිම කරන දිනය තවදුරටත් පොළියද තුන්වන ණය මත 2018.06.20 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් තුන්කෝටි හැටහය ලක්ෂ තිස් හත් දහස් දෙසිය හැත්තෑ හයයි ශත අනූහයක) (රු.36,637,276.96) මුදල සමග රුපියල් තුන්කෝටි පනස් ලක්ෂ පනස් හය දහස් තුන්සිය තිස්පහයි ශත දහනවයක (රු. 35,056,335.19) මුදලක් මත වසරකට සියයට අටයි දශම බිංදුව (8.0%) බැගින් තව දුරටත් පොළිය ද අයිරාව මත 2018.06.20 වැනි දින තෙක් මුල් මුදල් හා ශේෂය වශයෙන් රුපියල් හැත්තෑ එක් ලක්ෂ හැත්තෑ දහස් හත්සිය හැත්තෑ පහයි ශත අනූනවයක (රු. 7,170,775.99) මුදල මත පොළිය ද රුපියල් හැට නව ලක්ෂ අනූපන් දහස් හත්සිය තිස් හතරයි ශත තිහක (රු. 6,995,734.30) මුදල මත වසරකට සියයට දාහතයි දශම බිංදුව (17.0%) බැගින් 2018.06.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තව දුරටත් පොළිය ද බදුල්ල, ඔලියමංඩිය, වටරවුම් පාර, අංක 53හි දොන් හේමන්ත සෝලංග මහතා (බදුල්ල, කඩවීදිය, අංක 27හි) නෙස්ට් ලයින් හි තනි අයිතිකරු) වෙතින් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් එම්. බී. ටී. ආර්. සිරිවර්ධන මහත්මිය විසින් සහතික කරන ලද 2014.12.01 දිනැති අංක 186 දරන උකස් බැඳුම්කරය සහ 2014.12.01 දිනැති අංක 187 දරන උකස් බැඳුම්කරය අනුව පළමු ණය මත 2018.06.20 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් දසකෝටි හැට හත් ලක්ෂ අසූඅට්ක දහස් හාරසිය දෙකෙයි ශත පනස්තුනක (රු. 106,781,402.53) මුදල සමග රුපියල් දස කෝටි විසිඑක් ලක්ෂ හතළිස් දහස් එකසිය හැත්තෑ නවයයි ශත හතළිස් පහක (රු. 102,140,179.45) මුදල මත වසරකට සියයට අටයි දශම බිංදුව (8.0%) බැගින් 2018.06.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තව දුරටත් පොළියක් ද දෙවන ණය මත 2018.06.20 වැනි දින තෙක් මුදල් මත හා පොළිය වශයෙන් රුපියල් දෙකෝටි එක් ලක්ෂ දොළොස් දහස් හත්සිය පනස් හතරයි ශත අසූ අටක (රු. 20,112,754.88) මුදල සමග රුපියල් එක්කෝටි අනූ දෙලක්ෂ තිස් අට දහස් නවසිය හැත්තෑ හතරයි ශත හැත්තෑ එකක (රු. 19,238,974.71) මුදල මත වසරකට සියයට අටයි බිංදුව (8.0%) බැගින් 2018.06.21 වැනි දින සිට ගෙවීම් නිම කරන දිනය තවදුරටත් පොළිය ද අයිරාවෙහි හිඟහිටි ශේෂය සහ ඒ සමග රුපියල් තුන්කෝටි හැටහය ලක්ෂ තිස්හත් දහස් දෙසිය හැත්තෑ හයයි ශත අනූහයක) (රු. 36,637,276.96) පොළියක්ද 2018.06.20 වැනි දින සිට රුපියල් තුන්කෝටි පනස් ලක්ෂ පනස්හය දහස් තුන්සිය තිස්පහයි ශත දහනවයක (රු. 35,056,335.19) මුදලක් මත වසරකට සියයට අටයි දශම බිංදුව (8.0%) බැගින් තවදුරටත් පොළිය ද 2018.06.21 වැනි දිනට ස්ථිර අයිරාවෙහි හිඟහිටි ශේෂය සහ ඒ සමග රුපියල් හැත්තෑ එක් ලක්ෂ හැත්තෑ දහස් හත්සිය හැත්තෑ පහයි ශත අනූනවයක (රු. 7,170,775.99) මුදල මත පොළිය ද රුපියල් හැට නව ලක්ෂ අනූපන් දහස් හත්සිය තිස් හතරයි ශත තිහක (රු. 6,995,734.30) මුදල මත වසරකට සියයට දාහතයි දශම බිංදුව (17.0%) බැගින් 2018.06.21 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 182/3, (50/3) හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, බදුල්ල නගර ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

පළමු උපලේඛනය

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර මහා සීමාව තුළ කනුපැලැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, යක්අරාවේගම ග්‍රාමයේ පිහිටි කනුපැලැල්ල පාරේ වරිපනම් අංක 317A (උද්‍යානය) දරන "තිබ්බොටුගහඅරාවේ පාරෙන් පල්ලෑ කැබැල්ල හෙවත් තිබ්බොටුගහඅරාවේවත්ත" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එච්. ඩබ් එල්. අරුණකාන්ත විසින් සාදන ලද 2014.09.23 දිනැති අංක 845 දරන පිඹුරෙහි ලොට් අංක 02 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 02 උතුරට : ලොට් අංක 01 ද, නැගෙනහිරට: කුඩා ඔය ද, දකුණට : ඇල ද, බස්නාහිරට : කනුපැලැල්ල පාර ද මායිම්ව රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 1, පර්. 0.80) හෙවත් හෙක්ටයාර් 0.1032ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේද අයත් වේ. එකී අංක 845 දරන පිඹුරෙහි එකී ලොට් 01 සහ 02 මෙහි පහත වඩාත් විස්තර කොට ඇති ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් හා උපබෙදීමක් වේ..

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර මහා සීමාව තුළ කනුපැලැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, යක්අරාවේගම ග්‍රාමයේ පිහිටි "තිබ්බොටුගහඅරාවේ පාරෙන් පල්ලෑ කැබැල්ල හෙවත් තිබ්බොටුගහඅරාවේවත්ත" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එම්. පී. ගුණරත්න විසින් සාදන ලද 2007.05.27 දිනැති අංක 2919 දරන පිඹුරෙහි ලොට් අංක 01 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01 උතුරට : විල්සන් හේවගේට අයිති ගෙවත්ත ද, නැගෙනහිරට: කුඩා ඔය ද, දකුණට : බලයලත් මිනින්දෝරු එම්. එම්. බී. දිසානායක විසින් සාදන ලද අංක 1563 දරන පිඹුරෙහි ලොට් අංක 01, බස්නාහිරට : කනුපැලැල්ල පාර සහ අඩි පාර ද මායිම්ව පර්චස් විසි එකයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 21.90) හෙවත් හෙක්ටයාර් 0.0554ක ඉඩම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 102/121 හි ලියාපදිංචි කර ඇත.

2. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර මහා සීමාව තුළ කනුපැලැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, යක්අරාවේගම ග්‍රාමයේ පිහිටි කනුපැලැල්ල පාරේ වරිපනම් අංක 317A (උද්‍යානය) දරන "තිබ්බොටුගහඅරාවේ පාරෙන් පල්ලෑ කැබැල්ල හෙවත් තිබ්බොටුගහඅරාවේවත්ත" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩී. එම්. බී. බී. දිසානායක විසින් සාදන ලද 2003.12.14 දිනැති අංක 1563 දරන පිඹුරෙහි ලොට් අංක 01 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01 උතුරට : විල්සන් හේවගේට අයිති වත්ත ද, නැගෙනහිරට: කුඩා ඔය ද, දකුණට : ඇල ද, බස්නාහිරට : කනුපැලැල්ල පාර ද මායිම්ව එකී අංක 1563 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 1, පර්. 0.80) හෙවත් හෙක්ටයාර් 0.1032ක ඉඩම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 130/110 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ඩී. එම්. එම්. බී. දිසානායක විසින් සාදන ලද 2003.12.14 දිනැති අංක 1563 දරන පිඹුරෙහි නිරූපිත එකී ලොට් 01 බලයලත් මිනින්දෝරු එම්. පී. ගුණරත්න විසින් මෑතකදී සාදන ලද 2007.05.03 දිනැති අංක 3017 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

3. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බදුල්ල මහ නගර මහා සීමාව තුළ කනුපැලැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, යක්අරාවේගම ග්‍රාමයේ පිහිටි "තිබ්බොටුගහඅරාවේ පාරෙන් පල්ලෑ කැබැල්ල හෙවත් තිබ්බොටුගහඅරාවේවත්ත" නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එම්. පී. ගුණරත්න විසින් සාදන ලද 2007.05.03 දිනැති අංක 3017 දරන පිඹුරෙහි ලොට් අංක 01 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01 උතුරට : විල්සන් හේවගේට අයිති වත්ත ද, නැගෙනහිරට : කුඩා ඔය ද, දකුණට : ඇල ද, බස්නාහිරට : කනුපැලැල්ල පාර ද මායිම්ව එකී අංක 3017 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 1, පර්. 0.80) හෙවත් හෙක්ටයාර් 0.1032ක ඉඩම් ප්‍රමාණයකින් යුක්ත වේ.

දෙවැනි උපලේඛනය

1. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවේ, බදුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කඩ වීදියෙහි පිහිටි බදුල්ල නෙස්ට් ලයින් සමග ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේද සමග කඩ වීදියේ, වරිපනම් අංක 27 දරන අංක 36 දරන පරිශ්‍රය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද 2004.03.02 දිනැති අංක 6935 දරන පිඹුරෙහි ලොට් අංක 01 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 01 උතුරට : උතුරු පටුමග ද, නැගෙනහිරට : බදුල්ල කඩ වීදියේ වරිපනම් අංක 29 දරන පරිශ්‍රය ද, දකුණට : කඩ වීදිය ද, බස්නාහිරට : බදුල්ල කඩ වීදිය ද වරිපනම් අංක 25 දරන පරිශ්‍රයද මායිම්ව එකී අංක 6935 දරන පිඹුරට අනුව පර්චස් හතරයි දශම පහයි හතක (අ. 0, රූ. 0, පර්. 4.57) හෙවත් හෙක්ටයාර් 0.0115ක බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 136/107 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. සී. බී. වීරසිංහ මහතා.
කළමනාකරු.

ලංකා බැංකුව,
බදුල්ල නගර ශාඛාව.

09 - 888

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - ලෝක වෙළඳ මධ්‍යස්ථාන ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : ෆ්රොස්ට්එයාර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත නම් සඳහන් ෆ්රොස්ට්එයාර් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනදායි/ උකස්කරු" ලෙස ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2003.01.23 වැනි දිනැති අංක 1286 දරන ප්‍රාථමික උකස්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඉන්ද්‍රා බදුගේ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2011.12.07 වැනි දිනැති අංක 432 දරන උකස්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මායාදුන්නේ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.12.07 වැනි දිනැති අංක 300 දරන තෘතීයක උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.10.24 වැනි දිනැති අංක 2519 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බැන්කිං කෝර්පරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 1286, 432, 300 සහ 2519 දරන උකස්කරයන් මත,

(අ) වර්ෂ 2018.02.05 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් විසි මිලියන හත්ලක්ෂ එකොළොස් දහස් හයසිය තුනයි ශත දහඅටක (රු. 20,711,603.18) මුදලක් ද සහ වර්ෂ 2018.02.06 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් දහනව මිලියන අටලක්ෂ හැටනවදහස් තුන්සිය හතලිස් දෙකයි ශත පනහක (රු. 19,869,342.50) මුදලක් දක්වා වර්ෂයකට 20% ක පොලිය ද,

(ආ) වර්ෂ 2018.02.05 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් විසිහත්ලක්ෂ අසූ හතර දහස් අටසිය අසූ දෙකයි ශත එකොළහක (රු. 2,784,882.11) මුදලක් ද, වර්ෂ 2018.02.06 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් විසි හයලක්ෂ හැටඑක්දහස් පනස් දෙකයි ශත දහහතරක (රු. 2,661,052.14) මුදලක් දක්වා වර්ෂයකට 20% ක පොලිය ද,

(ඇ) වර්ෂ 2018.02.05 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් අසූනවලක්ෂ හත්දහස් අටසිය හතලිස් දෙකයි ශත අසූ තුනක (රු. 8,907,842.83) මුදලක් ද, වර්ෂ 2018.02.06 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් අසූ තුන්ලක්ෂ අසූ අටදහස් නවසිය අනූ එකයි ශත පනස් තුනක (රු. 8,388,991.53) මුදලක් දක්වා වර්ෂයකට 20% ක පොලිය ද,

(ඈ) වර්ෂ 2018.02.05 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් පහලොස් මිලියන අට ලක්ෂ නව දහස් පන්සිය හතලිස් තුනයි ශත විසි හත (රු. 15,809,543.27) ක මුදලක් ද, වර්ෂ 2018.02.06 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් පහලොස් මිලියන හතලිස් පන් ලක්ෂ හාරසිය හැට නවයයි ශත හතක (රු. 15,045,469.07) මුදලක් දක්වා වර්ෂයකට 20% ක පොලිය ද,

(ඉ) වර්ෂ 2018.01.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් අයවිය යුතු රුපියල් තිස් දෙදහස් දහතුන් දහස් පනස් අටයි ශත තිස් හතක (රු. 3,213,058.37) මුදලක් ද වර්ෂ 2018.02.01 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් 3,000,000.00 ක සීමාව දක්වා වර්ෂයකට 18% ක පොලිය ද රු. 3,000,000.00 ක සීමාව ඉක්මවන මුදල මත වර්ෂයකට 29% ක පොලිය ද ඉහත කී බන්ධනදායී/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු එකී මුළු මුදල වන රුපියල් පනස් එක් මිලියන හාර ලක්ෂ විසිහයදහස් නවසිය විසි නවයයි ශත හැත්තෑ හයක (රු. 51,426,929.76) මුදලක් සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොලිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කරගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ, දුටුග ැමුණු මාවත, අංක 369 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

ඉහත කී උපලේඛනය

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාවෙහි කොම්පඤ්ඤ වීදියේ, යූනියන් පෙදෙසෙහි වරිපනම් අංක 102 දරන උතුරින් : යූනියන් පෙදෙස ද,, නැගෙනහිරින් : යූනියන් පෙදෙසේ වරිපනම් අංක 108 ද, , දකුණින් : ලීලී වීදියේ වරිපනම් අංක 6 ද, බස්නාහිරින්: යූනියන් පෙදෙසෙහි වරිපනම් අංක 98 ද, මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම හයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 6.62) විශාලත්වයක් ඇති, බලයලත් මිනින්දෝරු වී. කාර්තිගේසු විසින් ලියා සහතික කරන ලද 1946 ජූලි මස 18 වැනි දිනැති අංක 579 දරන පිඹුරෙහි දැක්වෙන ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළුව සියලු දෙය වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1017/266 හි ලියාපදිංචිව ඇත.

(2) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවෙහි වැලිසර උප කාර්යාල සීමාවෙහි සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මත්තුමගල අංක 177 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මත්තුමගල පිහිටා ඇති කොට්ඨාස අංක 05 හි ගුණසේකර මාවතේ, වරිපනම් අංක 25 දරන (බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් මැන සාදන ලද) 1972.02.17 දිනැති අංක 2368 දරන පිඹුරෙහි දැක්වෙන ඉඩමෙහි කොටසක් වන) බලයලත් මිනින්දෝරු එන්. ඩී. සිරිසේන විසින් තල්ගහවත්ත සහ කහටගහවත්ත නැමැති ඉඩම මැන සාදන ලද 1980 දෙසැම්බර් මස 17 දිනැති අංක 3968 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් 1 දරන කැබැල්ල නැමැති උතුරින් : ගුණසේකර මාවත සහ පී. එන්. සුනිල් රූපසිංහ සතු ඉඩම ද, නැගෙනහිරින් : පී. එන්. සුනිල් රූපසිංහ සතු ඉඩමද, ඇන්ඩෘෘ අමරසේකරගේ උරුමක්කරුවන් සතු ඉඩම ද, දකුණින් : ඇන්ඩෘෘ අමරසේකරගේ උරුමක්කරුවන් සතු ඉඩම ද, බස්නාහිරින්: මැටිල්ඩා සෙනෙවිරත්න ගේ ඉඩම සහ සී. ගුණසේකරගේ උරුමක්කරුවන් සතු ඉඩම (ලොට් එෆ් සහ ඒ) ද, මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් තිස් පහ (අ. 01, රූ. 02, පර්. 35) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළුව සියලු දෙය වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 75/21 දරන පත්ඉරුවෙහි ලියාපදිංචිව ඇත.

නැවත කරන ලද මැනීමක් ප්‍රකාර මෙම ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවෙහි වැලිසර උප කාර්යාල සීමාවෙහි සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මත්තුමගල අංක 177 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මත්තුමගල පිහිටා ඇති ගුණසේකර මාවතේ, වරිපනම් අංක 25 දරන බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් මැන සාදන ලද 1991 අගෝස්තු මස 14 දිනැති අංක 3472 දරන පිඹුරෙහි දැක්වෙන තල්ගහවත්ත සහ කහටගහවත්ත නැමැති ඉඩමේ ලොට් 1 දරන කැබැල්ල නැමැති උතුරින් : ගුණසේකර මාවත සහ ගුණසේකර මාවත වරිපනම් අංක 19 දරන පරිශ්‍රය ද, නැගෙනහිරින් : ගුණසේකර මාවත වරිපනම් අංක 19 දරන පරිශ්‍රය ද ෆ්රොස්ට් එයාර් සමාගම හිමිකම් කියන ඉඩම ද, දකුණින් : ගුණසේකර මාවත වරිපනම් අංක 31/7 දරන පරිශ්‍රය ද මීගමුව පාර, අංක 714 ද, බස්නාහිරින්: ගුණසේකර මාවත වරිපනම් අංක 31 දරන පරිශ්‍රය ද කාමන් ගුණසේකර සහ වෙනත් අය සතු ඉඩම ද ගුණසේකර මාවතේ වරිපනම් අංක 31/6 දරන පරිශ්‍රය ද, මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් තිස් දෙකයි දශම පහ (අ. 01, රූ. 02, පර්. 32.5) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළුව සියලු දෙය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරිණී - ණය අයකර ගැනීම්.

09 - 823

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී -
නාවල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුගේ නම : ජයන්තා වික්‍රමසිංහ ගුණසේකර.

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඉහත නම් සඳහන් ජයන්තා වික්‍රමසිංහ ගුණසේකර යන අය විසින් බන්ධනදායි/උකස්කරු ලෙස ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. සූරියාරච්චි විසින් සහතික කරන ලද වර්ෂ 2016.03.16 වැනි දිනැති අංක 699 දරන ප්‍රාථමික උකස්කරය සහ 2017.06.13 දිනැති අංක 1002 දරන ද්විතියක උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බැන්කිං කෝර්පරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 699 සහ 1002 දරන උකස්කරයන් මත,

(අ) වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 01 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් තිස්හත් ලක්ෂ හැත්තෑ හත්දහස් එකසිය හැට හතරයි ශත දහ හතක (රු. 3,777,164.17) මුදලක් ද, වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 02 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් තිස්හය ලක්ෂ හැට හයදහස් එකසිය හැත්තෑ හතරයි ශත පනස් එකක් (රු. 3,666,174.51) දක්වා වූ මුදල මත වර්ෂයකට 19% ක පොළිය ද,

(ආ) වර්ෂ 2018ක් වූ අගෝස්තු මස 01 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් හතලිස් එක් ලක්ෂ පනස් හයදහස් එකසිය හයයි ශත පනස් අටක (රු. 4,156,106.58) මුදලක් ද, වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 02 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් හතලිස් ලක්ෂ තිස් තුන්දහස් නමසිය අසූ එකයි ශත අනූදෙකක් (රු. 4,033,981.92) දක්වා වූ මුදල මත වර්ෂයකට 19% ක පොළිය ද,

(ඇ) වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 01 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් එකළොස් මිලියන හාරලක්ෂ තිස් පන්දහස් හාරසිය හැත්තෑ නමයයි ශත දහනමයක (රු. 11,435,479.19) මුදලක් ද, වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 02 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම වන තුරු රුපියල් එකොළොස් මිලියන අනූනව දහස් හාරසිය පනස් හතරයි ශත හැට එකක් (රු. 11,099,454.61) දක්වා වූ මුදල මත වර්ෂයකට 19% ක පොළිය ද,

ඉහත කී බන්ධනදායීගෙන්/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු සම්පූර්ණ මුදල වන එකී රුපියල් දහනව මිලියන තුන් ලක්ෂ හැට අට දහස් හත්සිය හතලිස් නවයයි ශත අනූහතරක (රු. 19,368,749.94) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අය කර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොලෙන්නාව, විහාර මාවතේ අංක 182/3 (50/3) හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

ඉහත සඳහන් උපලේඛනය

(1) බස්නාහිර පළාතේ (දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, පිටකෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටකෝට්ටේ නැගෙනහිර අංක 522A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිටකෝට්ටේ බැද්දගාන පිහිටි පිටකෝට්ටේ බැද්දගාන උතුර, දුව පාර වරිපනම් අංක 162/4A, දූන් වරිපනම් අංක 162/3 දරන පෙළෙන්ගහ වත්ත නමැති බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 1994.03.14 දිනැති අංක 1654 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන ඉඩම (බලයලත් මිනින්දෝරු එස්. ඩී. සරත්චන්ද්‍ර විසින් මැන සාදන ලද 1990.11.30 දිනැති අංක 619 ඒ දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 හි නැවත මැනීමක් වන), උතුරින් : ලොට් 1 (පාර), පිඹුරු අංක 619ඒ හි ලොට් 3 සහ 4 ද, නැගෙනහිරින් : පිඹුරු අංක 619A ලොට් 3 සහ 4 ද, දකුණින් : ඒබ්‍රහම් අප්පුහාමි සහ තවත් අය සතු ඉඩම් ද (දැනට ජේ. ඩබ්ලිව්. ගුණසේකර) සහ බස්නාහිරින් : කේ. ඩී. ආරියපාල සහ තවත් අය හිමිකම් කියන ඉඩමද මායිම් වූ එකී පිඹුරු අංක 1654 හි දැක්වෙන පරිදි ප්‍රමාණයේ පර්චස් විසිනවයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 29.5) ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ සියලු දෙය වේ. මෙම ඉඩම දෙල්කඳ නුගේගොඩ ඉඩම් කාර්යාලය A300/11 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචිව ඇත.

එකී ලොට් 1 දරන ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමකි.

2) කොළඹ දිස්ත්‍රික්කයේ (දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, පිටකෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමව තුළ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටකෝට්ටේ නැගෙනහිර අංක 522A ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිටකෝට්ටේ බැද්දගාන පිහිටි පෙළෙන්ගහ වත්ත නමැති බලයලත් මිනින්දෝරු එස්. ඩී. සරත්චන්ද්‍ර විසින් මැන සාදන ලද 1990.11.30 දිනැති අංක 619A දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 යනුවෙන් දැක්වෙන, උතුරින් : ලොට් 1, 3 සහ 4 ද, නැගෙනහිරින් : ලොට් 3 සහ 4 ද, දකුණින් : කේ. ඩී. ඒබ්‍රහම් අප්පුහාමි සහ තවත් අය හිමිකම් කී ඉඩම ද, බස්නාහිරින් : කේ. ඩී. ආරියපාල සහ තවත් අය හිමිකම් කියන ඉඩම් ද මායිම් වූ එකී අංක 619A දරන පිඹුරේ දැක්වෙන පරිදි ප්‍රමාණයේ පර්චස් විසිනවයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 29.5) වූ ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි ආදී සියලු දෙය වේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය M 1781/242 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචිව ඇත.

තවද පහත දැක්වෙන ඉඩම මතින් සහ ඔස්සේ වන මාර්ග අයිතිය සමඟ වේ.

ඉහත කී පිටකෝට්ටේ බැද්දගානේ පිහිටි පෙළෙන්ගහවත්ත නමැති ඉහත කී අංක 619A දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 (අඩි 15 පළල මාර්ග රක්ෂිතය) වන, උතුරින් : පාර සහ පී. ඩබ්ලිව්. ද සිල්වා හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරින් : ලොට් 8 ද, දකුණින් : ලොට් 8, 7, 6, 5, 4, 3 සහ 2 ද, බස්නාහිරින් : කේ. ඩී. ආරියපාල සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, මායිම් වූ පිඹුරු අංක 619A පරිදි ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකයි දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 22.55) වූ විශාල ඉඩම වේ. මෙම ඉඩම දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලය A 191/40 හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමනාකාරිණී - ණය අයකර ගැනීම්.

09 - 824

සෙලාන් බැංකුව පීඑල්සී - කන්තලේ ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනාව

ගිණුම් අංකය : 1150-32559849-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 අගෝස්තු මස 27 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් එල්. බී. ජේ. පී. ටී. සම්පත් ක්‍රිෂාන්ත විසින් දෙකම සහතික කරන ලද 2014 සැප්තැම්බර් මස 11 දිනැති බැඳුම්කර අංක 330 සහ 2016 ජූලි මස 08 දිනැති බැඳුම්කර අංක 496 මත අයවිය යුතු මුදල් ගෙවීම, කන්තලේ පදිංචි ලොකු වඩුගේ අර්ජුන ඉසිර අල්විස් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි හැත්තෑනව ලක්ෂ හතලිස් නවදහස් තුන්සිය හතලිස් තුනයි ශත විසි හතක (රු. 17,949,343.27) ක මුදලක්, එකී බැඳුම්කර මත පහත සඳහන් පරිදි පහසුකම් සම්බන්ධයෙන් පොළිය සමඟ 2018 මැයි මස 08 වැනි දින වන විට මුල් මුදල සහ පොළිය වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුදල වන රුපියල් එක්කෝටි හැත්තෑනව ලක්ෂ හතලිස්නවදහස් තුන්සියහතලිස් තුනයි ශත විසි හතක් (රු. 17,949,343.27) මුදල, 2018 මැයි 09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා පහත සඳහන් පරිදි එකී පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම, දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම සඳහා එකී බැඳුම්කර අංක 330 සහ 496 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛන වල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර චන්දිමා ගමගේ මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන සංශෝධිත පරිදි බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) අයිරා අණකර පහසුකම් සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි දසලක්ෂ එක්දහස් තුන්සිය අනූතුනයි ශත විසිහතක මුදලක් (රු. 11,001,393.27), 2018 මැයි මස 09 දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට විසි අට (28%) බැගින් වන පොළියත් සමඟ

(ආ) වාර ණය 11 පහසුකම සම්බන්ධයෙන් රුපියල් හැට දෙලක්ෂ හැටහය දහස් හයසිය හැත්තෑඑකක (රු.6,266,671.00) මුදලක් 2018 මැයි 09 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහ නවය (19%) බැගින් වන පොළියත් සමඟ රුපියල් හැටනවලක්ෂ හතලිස්හත්දහස් නවසිය පනහක (රු. 6,947,950.00) මුදලක්.

01 උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලමඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුළ සහ බටහිර, බටපොල ජී. එස්. කොට්ඨාස අංක 75 තුළ එලුක්පිටිය ගමේ පිහිටි අංක පී. පී. ඒ. 1227 සැලැස්මේ නිරූපනය වන ලොට් 2 සහ 4 ලෙස ලකුණු කල බඩහැල උඩුමුල්ල සහ බඩහේන උඩුමුල්ලකැලේ ගල්වෙල උඩුමුල්ල බැද්ද නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 සහ පී. ඩබ්ලිව්. එඩ්මන් සිල්වා සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන බඩහැල උඩුමුල්ල නමැති වත්ත ද, නැගෙනහිරට : ටී. පී. ජයතිලක විසින් හිමිකම් කියනු ලබන ගල්වල උඩුමුල්ල නමැති වත්ත ද, දකුණට : පී. එච්. ලිසිනෝනා සහ තවත් අය හිමිකම් කියනු ලබන බඩහැල උඩුමුල්ල නමැති වත්ත ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් තුනයි පර්චස් විසි නවයක් (අ. 01, රූ. 03, පර්. 29) විශාල ඉඩම.

1. ඉහත සඳහන් ඉඩම නැවත මැන බලයලත් මිනින්දෝරු බර්ටි ඒ. ද සිල්වා විසින් සාදන ලද 2008.08.15 දිනැති අංක. 2008/50ඒ සැලැස්මේ සඳහන් ලොට් 4 ලකුණු කර බෙදාවෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : 2008.08.15 දිනැති අංක 2008/ 50ඒ සැලැස්මේ සඳහන් ලොට් 8 ද, නැගෙනහිරට : 2008.08.15 දිනැති අංක 2008/ 50ඒ සැලැස්මේ සඳහන් ලොට් 8 ද, දකුණට : 2008.08.15 දිනැති අංක 2008/ 50ඒ සැලැස්මේ සඳහන් ලොට් 5 ද, බස්නාහිරට : 2008.08.15 දිනැති අංක 2008/ 50ඒ සැලැස්මේ සඳහන් ලොට් 3 ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් දාහතරක් (අ. 0, රූ. 01, පර්. 14) විශාල, ගොඩනැගිලි, ගස්, වගාව සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම සහ 2008.08.15 දිනැති අංක 2008/50ඒ සැලැස්මේ සඳහන් ලොට් 7 සහ 8 උඩින් මාර්ග අයිතිය සමඟ.

2. ඉහත සඳහන් ඉඩම නැවත මැන බලයලත් මිනින්දෝරු බර්ටි ඒ. ද සිල්වා විසින් සාදන ලද 2008.08.15 දිනැති අංක 2008/50ඒ සැලැස්මේ සඳහන් ලොට් 1 ලකුණු කර බෙදාවෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : 2008.08.15 දිනැති අංක 2008/ 50ඒ සැලැස්මේ සඳහන් ලොට් 7 ද, නැගෙනහිරට : 2008.08.15 දිනැති අංක 2008/ 50ඒ සැලැස්මේ සඳහන් ලොට් 2 ද, දකුණට : 2008.08.15 දිනැති අංක 2008/ 50ඒ සැලැස්මේ සඳහන් ලොට් 2 ද, බස්නාහිරට : කහවබටපොල පාරද, යන මායිම් තුළ පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම සහ 2008.08.15 දිනැති අංක 2008/50ඒ සැලැස්මේ සඳහන් ලොට් අංක 7 උඩින් මාර්ග අයිතිය සමඟ.

2 උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ,හිරියාල හත්පත්තුවේ, ඉහළ විසිදෑකේ කෝරළේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පෙරියකාඩුනේලාව ග්‍රාම සේවා කොට්ඨාසය තුළ නෙලාව පිහිටි මිනුම්පති විසින් සාදන ලද අවසන් ග්‍රාම සැලසුම් අංක 1202 හි සඳහන් ලොට් 114 ලෙස නිරූපනය වන මකුල්මුලේවත්ත හෙවත් මහවෙලවත්ත නමැති එකී සැලැස්ම අනුව එකී අංක. ලොට් 114 ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් අංක. 55 ද, නැගෙනහිරට : ලොට් අංක. 28 ද, දකුණට : ලොට් අංක. 115 ද, බස්නාහිරට : ලොට් අංක 113 ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් පහක් (අ. 0, රූ. 1, පර්. 5) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ සහ එයට අයත් සියලු දේ සමඟ, ඉඩම.

පෙර කී පරිදි නෙලාව පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදන ලද 2006.06.27 දිනැති අංක. 2845 සැලැස්මේ සඳහන් ලොට් 1 ලෙස නිරූපනය වන එකී ඉඩම පසු මැනීමක් අනුව පහත සඳහන් පරිදි මායිම්, උතුරට : එෆ්වීපී 1202 හි ලොට් අංක. 55, ජේ.එම්. අනුර කුමාර ජයසුන්දර සහ තවත් අයට හිමි ඉඩම වන, නැගෙනහිරට: එෆ්වීපී 1202 හි සඳහන් ලොට් අංක. 28, පන්නලදියව ප්‍රධාන පාර වන, දකුණට: එෆ්වීපී 1202 හි ලොට් අංක. 115, බස්නාහිරට: එෆ්වීපී 1202 හි ලොට් අංක. 113, ඇලක් වන යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් පහක් (අ. 0, රූ. 1, පර්. 5) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
දෙපාර්තමේන්තු ප්‍රධානී - නීති.

09 - 812

සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඩබ්ලිව්. එම්. සී. එල්. බී. උයන්වත්ත.
ගිණුම් අංක : 0055 5001 4671.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.07.26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජී. කේ. ආලෝකබන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2017 මාර්තු මස 13 දාතම හා අංක 1034 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වීරසේකර මුදියන්සේලාගේ වමේර ලක්ෂිත බන්ඩාර උයන්වත්ත යන අය බන්ධදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක. 1034 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් හාරකෝටි හත් ලක්ෂ අනූ අට දහස් එකසිය හැත්තෑ හයයි ශත හතලිස් පහක (රු. 40,798,176.45) මුදලක් 2018 ජූනි මස 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාරකෝටි හත් ලක්ෂ අනූ අට දහස් එකසිය හැත්තෑ හයයි ශත හතලිස් පහක (රු. 40,798,176.45) මුදල ද, 2018 ජූනි මස 13 වැනි දින සිට අංක 1034 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි අසූ හත් ලක්ෂ පනස් දහසක (රු. 38,750,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදු වූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1034 දරන බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසි කරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

ඉහත කී උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කනදර කෝරළේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ අනුරාධපුරය මහ නගර සභා සීමාවන් තුළ අංක 239 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කුඩපලාඩිකුළම ග්‍රාමයේ පිහිටි වෝඩ් අංක. 07 හි බණ්ඩාරනායක මාවත වරිපනම් අංක. 748 දරන "කුඩපලාඩිකුළමමූකලාන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. සමරතුංග යන අය විසින් සාදන ලද 2013 මාර්තු මස 10 දාතම හා අංක. 2013/090 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදා වෙන් කොට "ලොට් 1" වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජී. එච්. ජිනදාස යන අයගේ ඉඩම, නැගෙනහිරට : පාර (මා.සං.අ.), දකුණට : ආර්ලිස් අප්පුහාමි යන අයගේ ඉඩම සහ බස්නාහිරට : අසෝක විරසිංහ යන අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (A.0, R.2, P. 0) හෝ හෙක්ටයාර 0.20235 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2013/090 දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව LDO D 14/28 (වෙනත් විස්තර තිරුව) යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

09 - 867

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk